# සංස්කෘත භාෂාව

# संस्कृत भाषा

## දෙවැනි ශ්‍රේණිය

## මූලික පිරිවෙන

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව



සියලු ම පෙළපොත් ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් ලබා ගැනීමට
www.edupub.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

ප්‍රථම මුද්‍රණය - 2012
දෙවන මුද්‍රණය - 2013
තෙවන මුද්‍රණය - 2014
සිව්වන මුද්‍රණය - 2015
පස්වන මුද්‍රණය - 2016
සයවන මුද්‍රණය - 2017
සත්වන මුද්‍රණය - 2018
අටවන මුද්‍රණය - 2019
නවවන මුද්‍රණය - 2020

සියලු ම හිමිකම් ඇවිරිණි.

**ISBN 978-955-25-0438-9**

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින්
නුගේගොඩ, ගංගොඩවිල, උඩහමුල්ල දුම්රියපළ පාර, නො. 44 දරන
ස්ථානයෙහි පිහිටි නියෝ ග්‍රැෆික්ස් (පුද්ගලික) සමාගමෙහි
මුද්‍රණය කරවා ප්‍රකාශයට පත් කරන ලදි.

Published by: Educational Publications Department
Printed by: Neo Graphics (Pvt) Ltd

# ශ්‍රී ලංකා ජාතික ගීය

ශ්‍රී ලංකා මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
සුන්දර සිරිබරිනී, සුරැඳි අති සෝබමාන ලංකා
ධාන්‍ය ධනය නෙක මල් පලතුරු පිරි ජය භූමිය රම්‍යා
අපහට සැප සිරි සෙත සදනා ජීවනයේ මාතා
පිළිගනු මැන අප භක්ති පූජා
නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා
ඔබ වේ අප විද්‍යා - ඔබ ම ය අප සත්‍යා
ඔබ වේ අප ශක්ති - අප හද තුළ භක්ති
ඔබ අප ආලෝකේ - අපගේ අනුප්‍රාණේ
ඔබ අප ජීවන වේ - අප මුක්තිය ඔබ වේ
නව ජීවන දෙමිනේ නිතින අප පුබුදු කරන් මාතා
ඥාන වීර්ය වඩවමින රැගෙන යනු මැන ජය භූමි කරා
එක මවකගෙ දරු කැල බැවිනා
යමු යමු වී නොපමා
ප්‍රේම වඩා සැම භේද දුරැර ද නමෝ නමෝ මාතා
අප ශ්‍රී ලංකා, නමෝ නමෝ නමෝ නමෝ මාතා

අපි වෙමු එක මවකගෙ දරුවෝ
එක නිවසෙහි වෙසෙනා
එක පාටැති එක රුධිරය වේ
අප කය තුළ දුවනා

එබැවිනි අපි වෙමු සොයුරු සොයුරියෝ
එක ලෙස එහි වැඩෙනා
ජීවත් වන අප මෙම නිවසේ
සොඳින සිටිය යුතු වේ

සැමට ම මෙත් කරුණා ගුණෙනී
වෙළී සමගි දමිනී
රන් මිණි මුතු නො ව එය ම ය සැපතා
කිසි කල නොම දිරනා

ආනන්ද සමරකෝන්

# පෙරවදන

සියවස් ගණනාවක කීර්තිමත් ඉතිහාසයකට උරුමකම් කියන්නා වූ පිරිවෙන් අධ්‍යාපන සම්ප්‍රදාය වූ කලී සිරිලක අධ්‍යාපනයේ ස්වර්ණමය සලකුණකි. මහින්දාගමනයත් සමඟින් වඩාත් ශිෂ්ට සම්පන්න සංස්කෘතියක් වෙත අප ගමන් කළේ සුවිශේෂ වූ ශාස්ත්‍රීය දියුණුවක් ද අත්පත් කරගනිමිනි. එහිදී භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වණක් පිරිස වෙතම ප්‍රභාෂ්වර ශාස්ත්‍රාලෝකය දායාද කළ ප්‍රදීපස්තම්භය වූයේ පිරිවෙනයි.

අපේ සම්භාව්‍ය පිරිවෙන් අධ්‍යාපනය, ත්‍රිවිධ ශාසනයේ ආරක්ෂාව හා අභිවෘද්ධිය වෙනුවෙන් කැපවන සුපසන් යතිපරපුරක් නිර්මාණය කරන අතර සම්භාව්‍ය භාෂා මෙන්ම අනේක ශිල්ප ශාස්ත්‍ර පිරිසිඳ දත් වියතුන් ලොවට දායාද කිරීමෙහිලා මූලික වූ බැව් සිහිපත් කළ යුතු ය. එසේම මෙරට විවිධ උවදුරු පිරි අඳුරු සමයන්හි පිරිහී ගිය පිරිවෙන් අධ්‍යාපනය යළි නඟා සිටුවීමට දිවිහිමියෙන් ඇප කැප වූ, වැලිවිට අසරණ සරණ සරණංකර සඟරජ මාහිමිපාණන්ගේ අපරිමිත සේවාව ද කෘතවේදීත්වයෙන් යුතුව මේ මොහොතේ සිහිපත් කළ යුතු ය.

අතීත සම්භාවනීය අධ්‍යාපන උරුමය ද එකලෙසින් සුරකිමින් නව ලොවට අනුගත වූ පිරිවෙන් විද්‍යාස්ථාන නිර්මාණය කිරීමේ කාර්යය වෙත අපි සැම අවතීර්ණ වී සිටින්නෙමු. විශ්ව ගම්මානයෙහි හුදකලා නොවී වර්තමාන පිරිවෙන් ශිෂ්‍ය ගණයා දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය කරගනිමින් අධ්‍යාපන සයුරෙහි කිමිදෙමින් සිටිනු දැකීම සන්තුෂ්ටිය උපදවන්නකි. විවිධ ගැටලු හේතුවෙන් විධිමත් පාසල් පද්ධතියෙන් බැහැර වූ ඇතැම් සිසුන් ද යළි පිරිවෙන් විදුබිම් වෙත පැමිණ ස්වකීය දිවිමඟ යළි එළිය කරගත් අවස්ථා සඳහා නිදසුන් අපමණ බව සඳහන් කළ යුතු ය. සැමට අධ්‍යාපනය ලබාදීමේ උත්කෘෂ්ට කර්තව්‍යය වෙනුවෙන් පිරිවෙන් විද්‍යාස්ථාන ද ඇප කැප වී සිටින බවට එය කදිම සාක්ෂ්‍යයකි.

මෙම පොත් මැනවින් පරිශීලනය කරමින් ඒ ඔස්සේ නව නවත් පුළුල් දැනුම් අවකාශ පිරි ඉසව් වෙත පිවිසෙන්නට ද ඔබ සැමට ඇරයුම් කරමි. මනා ඉගෙනුමක් ලැබූ හා ආධ්‍යාත්මික සුවපත් භාවයෙන් පිරිපුන් සුපසන් සිසු පරපුරක් බිහිවනු දැකීම රජයේ ඒකායන අරමුණයි. ඒ සඳහා ඇප කැපවන්නට හැකිවේවායි සියලු දෙනා වෙත ආශීර්වාද කරමි. මේ සත්කාර්යය වෙනුවෙන් නොමසුරු දායකත්වයක් සැපයූ සියලු පිරිවර වෙත ද මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

**පී. එන්. අයිලප්පෙරුම**
අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
ඉසුරුපාය
බත්තරමුල්ල

## නියාමනය හා අධීක්ෂණය

පී. එන්. අයිලප්පෙරුම - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්,
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## මෙහෙයවීම

පූජ්‍ය වටිනාපහ සෝමානන්ද හිමි - අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්),
අධ්‍යාපන අමාත්‍යාංශය.

ඩබ්ලිව්. ඒ. නිර්මලා පියසීලි - අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් (සංවර්ධන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## සම්බන්ධීකරණය

පූජ්‍ය රංවල පඤ්ඤාවාස හිමි - පිරිවෙන් අධ්‍යාපන සම්බන්ධීකරණ නිලධාරී,
අධ්‍යාපන අමාත්‍යාංශය.

ඩී. එම්. ජේ. පුෂ්පකුමාර - නියෝජ්‍ය කොමසාරිස්, (පාලන)
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

ප්‍රදීප් ඉඳුනිල් පියරත්න (2020 මුද්‍රණය) - සහකාර කොමසාරිස්
අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

## උපදේශක මණ්ඩලය

මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි - සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

මහාචාර්ය පූජ්‍ය නෙළුවේ සුමනවංශ හිමි - අංශාධිපති,
සංස්කෘත අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
හෝමාගම.

පූජ්‍ය ඇඹෝගම විමලඤාණ හිමි - අංශාධිපති,
සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

මහාචාර්ය සමන් චන්ද්‍ර රණසිංහ - අංශාධිපති,
සංස්කෘත අධ්‍යයන අංශය,
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය,
නුගේගොඩ.

## ලේඛක මණ්ඩලය

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි (සභාපති) - සමස්ත ලංකා සංස්කෘත විෂය උපදේශක,
අධ්‍යාපන අමාත්‍යාංශය.

පූජ්‍ය අබේසේකරගම විජිත හිමි - පරිවේණාචාර්ය,
ගා/ ශ්‍රී ජේතවන විද්‍යායතන පිරිවෙන,
කුඹල්වැල්ල, ගාල්ල.

පූජ්‍ය දේවගොඩ පියරතන හිමි - සහකාර කථිකාචාර්ය,
සංස්කෘත අධ්‍යයන අංශය,
කැලණිය විශ්වවිද්‍යාලය.

ඒ.එම්.ඩී.වයි. සරච්චන්ද්‍ර අමරතුංග - පරිවේණාචාර්ය,
බප/ ජය/ විද්‍යාලංකාර පිරිවෙන,
පන්නිපිටිය.

## සංස්කරණය

මහාචාර්ය වෝල්ටර් මාරසිංහ - සංස්කෘත අධ්‍යයන අංශය,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
පිටිපන උතුර, හෝමාගම.

## සෝදුපත් කියවීම

පූජ්‍ය කෙහෙල්වල සුමංගල හිමි - පරිවේණාධිපති,
ගා/ හෙට්ටියාවල මහ පිරිවෙන,
උණවටුන, ගාල්ල.

## පිටකවරය

ඩබ්.අයි. හංසිකා ධීරසේකර - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## පරිගණක තාක්ෂණය

පූජ්‍ය අබේසේකරගම විජිත හිමි - පරිවේණාචාර්ය,
ගා/ ශ්‍රී ජේතවන විද්‍යායතන පිරිවෙන,
කුඹල්වැල්ල, ගාල්ල.

පූජ්‍ය රඹාවැවේ පාලිත හිමි - සමස්ත ලංකා සංස්කෘත විෂය උපදේශක,
අධ්‍යාපන අමාත්‍යාංශය.

# පටුන


| | | |
|---|---|---|
| 01. | අක්ෂර හඳුනා ගනිමු | 1 - 7 |
| 02. | ස්වර ප්‍රභේද හඳුනා ගනිමු | 8 - 10 |
| 03. | ව්‍යඤ්ජන ප්‍රභේද හඳුනා ගනිමු | 11 - 14 |
| 04. | නාමපද හඳුනා ගනිමු | 15 - 17 |
| 05. | විභක්ති -I (ප්‍රථමා විභක්තිය) | 18 - 21 |
| 06. | නාම විශේෂණ | 22 - 25 |
| 07. | වර්තමානකාල ක්‍රියාපද | 26 - 28 |
| 08. | විභක්ති II (සම්බෝධන විභක්තිය) | 29 - 33 |
| 09. | විභක්ති III (ද්විතීයා විභක්තිය) | 34 - 37 |
| 10. | විභක්ති IV ( තෘතීයා විභක්තිය) | 38 - 42 |
| 11. | විභක්ති (තෘතීයා ප්‍රයෝග) | 43 - 46 |
| 12. | විභක්ති V (චතුර්ථී විභක්තිය) | 47 - 52 |
| 13. | අතීතකාල ආඛ්‍යාත | 53 - 57 |
| 14. | විභක්ති VI (පඤ්චමී විභක්තිය) | 58 - 61 |
| 15. | විභක්ති VII (ෂෂ්ඨී විභක්තිය) | 62 - 65 |
| 16. | විභක්ති VIII (සප්තමී විභක්තිය) | 66 - 70 |
| 17. | අව්‍යය පද | 71 - 75 |
| 18. | අනාගතකාල ක්‍රියාපද | 76 - 78 |
| 19. | සන්ධි | 79 - 83 |

01
පාඩම
प्रथमः पाठः

# අක්ෂර හඳුනා ගනිමු

## අක්ෂර

*භාෂාවක කතා කිරීමට යොදා ගන්නා වචන ලියා තැබීම සඳහා භාවිත කෙරෙන සංකේත අක්ෂර නම් වේ. ලෝකයේ විවිධ භාෂා විශාල සංඛ්‍යාවක් ඇති අතර ඒවා ලියා තැබීමට ඇතැම් භාෂාවන්ට වෙන් වූ අක්ෂර රූප ඇත. සංස්කෘත භාෂාවට ද වෙන් වූ අක්ෂර මාලාවක් හා එම අක්ෂර ලියා දැක්වීමට වෙන් වූ සංකේත රූප මාලාවක් ද ඇත. එම සංස්කෘත භාෂාව ලියන අක්ෂර දේවනාගරී අක්ෂර නමින් හැඳින්වේ. දැනටමත් ඔබ පළමු ශ්‍රේණියේ දී දේවනාගරී අක්ෂර උගෙන ඇති අතර මෙම ශ්‍රේණියේ දී ඒවා පිළිබඳ වැඩි දුරටත් විස්තරාත්මක ව උගනිමු.*

## 1. දේවනාගරී අක්ෂර මාලාව

සංස්කෘත භාෂාවේ දේවනාගරී අක්ෂර පිළිබඳ මීට පෙර වසරේ දී ද ඔබ උගෙන ඇත. එහි දී ස්වර, ව්‍යඤ්ජන, පිලි භාවිතය ආදිය පිළිබඳ උගෙන ඇති අතර එම කරුණු නැවත සිහිපත් කර ගනිමු. ස්වර අක්ෂර (14) දහහතරකින් හා ව්‍යඤ්ජන අක්ෂර (35) තිස්පහකින් ද සමන්විත දේවනාගරී අක්ෂර මාලාව මෙසේ ය.

### ස්වර - 14

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| अ | आ | इ | ई | उ | ऊ | ऋ |
| ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |

### ව්‍යඤ්ජන - 35

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

## 2 සංස්කෘත භාෂාවේ පිලි භාවිතය

**පිලි භාවිතය**

| ව්‍යඤ්ජන අක්ෂර | ස්වර අක්ෂර | යෙදෙන පිල්ල | පිල්ල සහිත අක්ෂර |
|---|---|---|---|
| क् | अ | - | क |
| क् | आ | ा | का |
| क् | इ | ि | कि |
| क् | ई | ी | की |
| क् | उ | ु | कु |
| क् | ऊ | ू | कू |
| क् | ऋ | ृ | कृ |
| क् | ॠ | ॄ | कॄ |
| क् | ऌ | ॢ | कॢ |
| क् | ॡ | ॣ | कॣ |
| क् | ए | े | के |
| क् | ऐ | ै | कै |
| क् | ओ | ो | को |
| क् | औ | ौ | कौ |

| ස්වර | | පිලි | | | පිලි යෙදුණු වචන | |
|---|---|---|---|---|---|---|
| සිං: | සං:ස්: | සිංහල | සං:ස්: | පිලි යෙදීම | ස්වර ආරෝපණය වන අයුරු | වචන |
| අ | अ | - | - | क | क् + अ - क | कमल |
| ආ | आ | ා - ඇලපිල්ල | ा | का | क् + आ - का | कासार |
| ඉ | इ | ි - ඉස්පිල්ල | ि | कि | क् + इ - कि | किरण |
| ඊ | ई | ී - දීර්ඝ ඉස්පිල්ල | ी | की | क् + ई - की | कीटक |
| උ | उ | ු / ු - පාපිල්ල | ु | कु | क् + उ - कु | कुटीर |
| ඌ | ऊ | ූ / ූ - දීර්ඝ පාපිල්ල | ू | कू | क् + ऊ - कू | कूप |
| ඍ | ऋ | ෘ - ගැටය සහිත ඇලපිල්ල | ृ | कृ | क् + ऋ - कृ | कृपण |
| ඎ | ॠ | ෲ - ගැටය සහිත ඇලපිලි දෙක | ॄ | कॄ | क् + ॠ - कॄ | कॄकार |
| එ | ए | ෙ - කොම්බුව | े | के | क् + ए - के | केदार |
| ඓ | ऐ | ෛ - කොම්බු දෙක | ै | कै | क् + ऐ - कै | कैलास |
| ඔ | ओ | ො - කොම්බුව සහ ඇලපිල්ල | ो | को | क् + ओ - को | कोटर |
| ඖ | औ | ෞ - කොම්බුව සහ ගයනුකිත්ත | ौ | कौ | क् + औ - कौ | कौशिक |

## 1.1 අභ්‍යාසය

1. පහත සඳහන් හිස්තැන් සඳහා අදාළ සිංහල අක්ෂරය ලියන්න. මෙහි දී අභිමත වර්ණ භාවිත කරන්න.

अ..... ऊ..... ए..... आ..... ऋ.....

ऐ..... इ..... ॠ..... ओ..... ई .....

ऌ..... औ..... उ..... ॡ.....

2. පහත සඳහන් හිස්තැන්වලට අදාළ අක්ෂරය ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| क | ..... | ग | ..... | ङ |
| ..... | छ | ..... | झ | ..... |
| ट | ..... | ड | ..... | ण |
| ..... | थ | ..... | ध | ..... |
| प | ..... | ..... | ..... | म |
| ..... | र | ल | ..... | |
| श | ..... | स | ..... | |
| ..... | अः | | | |

3. පහත දැක්වෙන හ්‍රස්ව ස්වර නාගරී අකුරින් ලියා ඒවායේ දීර්ඝ ස්වර ලියන්න.

| | |
|---|---|
| අ → .................. | ඉ → .................. |
| උ → .................. | ඍ → .................. |
| ඏ → .................. | |

4. මේවා දේවනාගරී අක්ෂර භාවිත කරමින් ලියන්න (අභිමත වර්ණ භාවිත කරන්න).

| | | | | |
|---|---|---|---|---|
| ක ........ | ඛ ........ | ග ........ | ඝ ........ | ඞ ........ |
| ච ........ | ඡ ........ | ජ ........ | ඣ ........ | ඤ ........ |
| ට ........ | ඨ ........ | ඩ ........ | ඪ ........ | ණ ........ |
| ත ........ | ථ ........ | ද ........ | ධ ........ | න ........ |
| ප ........ | ඵ ........ | බ ........ | භ ........ | ම ........ |
| ය ........ | ර ........ | ල ........ | ව ........ | |
| ශ ........ | ෂ ........ | ස ........ | හ ........ | |
| අං ........ | අඃ ........ | | | |

## 1.2 අභ්‍යාසය

1. ව්‍යඤ්ජනයන්ට ස්වර ආරෝපණය වූ විට යෙදෙන නිවැරදි පිලි සහිත අකුරු ලියන්න

1. ग् + अ .............
2. च् + ई .............
3. ट् + उ .............
4. त् + इ .............
5. र् + ऊ .............
6. घ् + ऋ .............
7. ल् + ए .............
8. न् + ॠ .............
9. म् + ऐ .............
10. ब् + ओ .............
11. स् + औ .............

2. පළමු පේළියේ සඳහන් පිලි සහිත අකුරෙන් නියෝජනය වන නිවැරදි ස්වරය දෙවන පේළියෙන් තෝරා යා කරන්න

| | පළමු පේළිය | දෙවන පේළිය |
|---|---|---|
| 1. | दा | ऐ |
| 2. | रो | ॠ |
| 3. | गॄ | ई |
| 4. | थै | औ |
| 5. | टी | आ |
| 6. | तृ | ए |
| 7. | शे | ऋ |
| 8. | पि | इ |
| 9. | कौ | ओ |

## 1.3 අභ්‍යාසය

1. පහත සඳහන් වචන සිංහල අකුරින් ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. नयन । | (ඇස) | 2. चिबुक । | (නිකට) |
| 3. नासिका । | (නාසය) | 4. ऊरु । | (කලවා) |
| 5. शरीर । | (ශරීරය) | 6. मुख । | (මුඛය) |
| 7. पाद । | (පාදය) | 8. हृदय । | (හදවත) |
| 9. उदर । | (බඩ) | 10. लोम । | (ලොම්) |

2. පහත දක්වෙන වචන දේවනාගරී අකුරින් ලියන්න.

| | |
|---|---|
| 01. තාලු (තල්ල) | 02. ශ්‍රෝත (කණ) |
| 03. ඕෂ්ඨ (තොල්) | 04. දන්ත (දත්) |
| 05. හස්ත (අත) | 06. මනස් (මනස) |
| 07. ජිහ්වා (දිව) | 08. කණ්ඨ (බොටුව) |
| 09. අඞ්ක (උකුළ) | 10. කේශ (කෙස්) |
| 11. නඛ (නිය) | 12. අංගුෂ්ඨ (මාපට ඇඟිල්ල) |
| 13. මාංස (මස්) | 14. වංශ (කොඳු ඇටය) |

භාවිතයට

**नमः समन्तभद्राय - सर्वगोचरचक्षुषे ।**
**करुणामृतकल्लोल - सिन्धवे सूर्यबन्धवे ॥**

සියල්ල ගොදුරු වන ඇස් ඇති, කරුණාව නමැති අමා රළපෙළට මුහුදක් බඳු වූ, සූර්ය වංශයට ඥාති වූ, සැමතින් ම යහපත් වූ බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා!

02
පාඩම
द्वितीयः पाठः

# ස්වර ප්‍රභේද හඳුනා ගනිමු

*වෙනත් අක්ෂරයක උපකාරයක් නොමැති ව තනි තනි ව උච්චාරණය කළ හැකි අකුරු 'ස්වර' නම් වේ. ස්වර අක්ෂර මාලාවේ ප්‍රභේද පිළිබඳ තොරතුරු මෙහි දී ඔබට හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඒවා මැනවින් මතකයේ තබාගන්න.*

## स्वर ( ස්වර )

සංස්කෘත ස්වර දහහතරකි (14)කි.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| अ | आ | इ | ई | उ | ऊ | ऋ |
| ॠ | ऌ | ॡ | ए | ऐ | ओ | औ |

සංස්කෘත භාෂාවේ ස්වර මාලාව කොටස් දෙකකට (2) බෙදා දැක්විය හැකි ය. එනම්;

1. ह्रस्व ( හ්‍රස්ව )
2. दीर्घ ( දීර්ඝ ) යනුවෙනි.

**මෙම ප්‍රභේද දෙක පිළිබඳ සවිස්තර තොරතුරු පහත දැක්වේ.**

01. ह्रस्व (හ්‍රස්ව)

උච්චාරණයේ දී ඇදී නොකියවෙන, ඒක මාත්‍රාවක් ඇති ස්වර අක්ෂර 'හ්‍රස්ව ස්වර' නම් වේ. මේවා ගණනින් (5) පහකි .

अ इ उ ऋ ऌ

02. दीर्घ ( දීර්ඝ )

ඇදී කියවෙන, මාත්‍රා දෙකක් ඇති ස්වර දීර්ඝ ස්වර නම් වේ. ඒවා ගණනින් (9) නවයකි.

आ ई ऊ ॠ ॡ ए ऐ ओ औ

## 2.1 අභ්‍යාසය

(i) දේවනාගරී අක්ෂර මාලාවට අයත් සියලු ස්වර අක්ෂර පිළිවෙළින් ලියන්න. (මෙහි දී "සිංහල - පාලි" අක්ෂර මාලාවල 'ස්වර' සමග සසඳන්න)

(ii) ස්වරවලට අදාළ ව (ස්වරවලින් පටන් ගන්නා) සංස්කෘත වචන 02 බැගින් එකතු කරන්න.

## 2.2 අභ්‍යාසය

1.

**(i)** පහත සඳහන් වචන දේවනාගරී අකුරින් ලියන්න.

1. අගධ (බෙහෙත්)
2. ආරාම (ආරාමය)
3. ආවාට (වළ)
4. කදලී (කෙසෙල්)
5. උත්තර (උතුර)
6. උලූක (බකමූණා)
7. ඍග්වෙද (ඍග්වේදය)
8. කොකිල (කොවුලා)
9. ලගන (ලග්නය)
10. ඍකාර (ඍකාරය)
11. පුෂ්ප (මල)
12. ඓශ්වර්‍ය (ඉසුරුමත්)
13. ඕදන (බත්)
14. පෞරාණික (පැරණි)

**(ii)** පහත සඳහන් වචන සිංහල අකුරින් ලියන්න.

१ नर (මිනිසා)
२ नायक (නායකයා)
३ अतिथि (ආගන්තුකයා)
४ नदी (නදිය)
५ गुरु (ගුරුවරයා)
६ उलूखल (වංගෙඩිය)
७ नृपति (රජතුමා)
८ कृपण (අසරණයා)
९ नालिकेर (පොල්ගස)
१० कौमुदी (සඳරැස්)
११ वैशाख (වෙසක්)
१२ कपोत (පරවියා)
१३ हैरिक (හොරා)
१४ नौका (කුඩා නැව, ඔරුව)
१५ मौन (නිහැඬියාව)

2. සංස්කෘත අක්ෂර මාලාවේ ස්වර ප්‍රභේද සහ ඊට අදාළ අක්ෂර වර්ගගත කොට දක්වන්න (ගුරුවරයාගේ උපදෙස් අනුගමනය කරන්න).

| ස්වර මාලාව | ह्रस्व | दीर्घ |
|---|---|---|
| ......... | ......... | ......... |

භාවිතයට

**सर्वभाषासु या श्रेष्ठा - या चाढ्या शास्त्रसंचयैः ।**
**श्रेयं संस्कृतभाषा ते - भूयाद् वृद्ध्यै शिवाय च ॥**

සියලු භාෂාවන් අතර උතුම් වූ ද ශාස්ත්‍ර සමූහයෙන් පොහොසත් වූ ද සංස්කෘත භාෂාව ඔබේ දියුණුව හා යහපත පිණිස වේවා !

03
පාඩම
तृतीयः पाठः

# ව්‍යඤ්ජන ප්‍රභේද හඳුනා ගනිමු

ස්වරයන්ගේ සහායෙන් තොර ව උච්චාරණය කළ නොහැකි අකුරු සමූහය "ව්‍යඤ්ජන" නම් වේ. ව්‍යඤ්ජන අක්ෂර මාලාවේ ප්‍රභේද පිළිබඳ තොරතුරු මෙහි දී ඔබට හඳුනා ගැනීමට හැකි වනු ඇත. ඒවා මැනවින් මතකයේ තබාගන්න.

## व्यञ्जन (ව්‍යඤ්ජන)

සංස්කෘත ව්‍යඤ්ජනාක්ෂර ගණනින් (35) තිස්පහකි. ඒ මෙසේ ය.

| | | | | |
|---|---|---|---|---|
| क | ख | ग | घ | ङ |
| च | छ | ज | झ | ञ |
| ट | ठ | ड | ढ | ण |
| त | थ | द | ध | न |
| प | फ | ब | भ | म |
| य | र | ल | व | |
| श | ष | स | ह | |
| अं | अः | | | |

සංස්කෘත භාෂාවේ ව්‍යඤ්ජන සමූහය කොටස් කීපයකට බෙදෙන අතර මෙම ශ්‍රේණියේ දී පහත සඳහන් කොටස් පිළිබඳ සාකච්ඡා කරනු ලැබේ.

1 वर्गाक्षर (වර්ගාක්ෂර)

2 वर्गान्त (වර්ගාන්ත)

3 अनुस्वार (අනුස්වාර)

4 विसर्ग (විසර්ග)

මෙම ප්‍රභේද පිළිබඳ සවිස්තර තොරතුරු පහත දක්වේ.

01. वर्गाक्षर (වර්ගාක්ෂර)

කකාරයේ සිට මකාරය දක්වා ඇති අකුරු 25 'වර්ගාක්ෂර' නම් වේ. ඒවා අකුරු (5) පහ බැගින් වර්ග පහකට (5) බෙදේ. ඒ ඒ වර්ග හඳුන්වන්නේ මුලට යෙදුණු අකුර අනුව යි. නිදසුන් :-

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| कवर्ग | - | क | ख | ग | घ | ङ |
| चवर्ग | - | च | छ | ज | झ | ञ |
| टवर्ग | - | ट | ठ | ड | ढ | ण |
| तवर्ग | - | त | थ | द | ध | न |
| पवर्ग | - | प | फ | ब | भ | म |

02. वर्गान्त (වර්ගාන්ත)

වර්ගාක්ෂරයන්ගේ අන්තයෙහි පිහිටි අක්ෂර වර්ගාන්ත වශයෙන් හැඳින්වේ.

නිදසුන් :-

ङ ञ ण न म

03. अनुस्वार (අනුස්වාර)

'ං' අනුස්වාර නම් වේ. එය ස්වරයකට පසුව යෙදී ඒ අනුව ශබ්ද වන බැවින් ඒ නම භාවිත වේ.

නිදසුන් :-

अं (අ)ං कं (ක)ං

04. विसर्ग (විසර්ග)

උඩ යට සිටින සේ යෙදෙන බින්දු දෙක 'විසර්ග' නම් වේ. විසර්ග යනු පිට කිරීම යි. මුවින් වායුව වේගයෙන් පිට කරමින් ශබ්ද වන හෙයින් ඒ නම යෙදේ. විසර්ජනීය යනු ද මෙයට නමකි.

නිදසුන් :-

(अ): (අ)ඃ (क): (ක)ඃ

## 3.1 ක්‍රියාකාරකම

රූප දෙක බැගින් භාවිත වන අක්ෂර උගනිමු.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අ | अ / अ | ඍ | ऋ / ऋ | ඎ | ॠ / ॠ | ඛ | ख / ख |
| ඣ | झ / झ | ණ | ण / ण | ල | ल / ल | ශ | श / श |

## 3.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ෂඩාශ්‍රයේ ඇතුළත් අක්ෂර පෙළගැස්ම නිවැරදි ව වර්ගවලට බෙදා දක්වන්න.




2. පහත රවුමෙහි දක්වා ඇති ව්‍යඤ්ජන අතුරින් වර්ගාන්ත තෝරා ලියන්න.



## 3.2 අභ්‍යාසය

1. පළමු පේළියේ අක්ෂරයන්ට ගැළපෙන රූපයෙන් වෙනස්, සමාන අක්ෂර දෙවන පේළියෙන් තෝරා එහි ඉලක්කම යොදන්න.

| පළමු පේළිය | | | දෙවන පේළිය |
|---|---|---|---|
| 1. अ | → | 6 | 1. झ |
| 2. ऋ | → | | 2. ण |
| 3. ॠ | → | | 3. ल |
| 4. ख | → | | 4. श |
| 5. झ | → | | 5. ऋ |
| 6. ण | → | | 6. अ |
| 7. ल | → | | 7. ख |
| 8. श | → | | 8. ॠ |

2. පහත සඳහන් වචන අක්ෂර රූප දෙකම භාවිත කොට නාගරී අකුරින් ලියන්න.

උදා:- 1. අඛිල > अखिल → अखिल 2. ශිඛර > शिखर → शिखर

1. අනල
2. ආකාශ
3. ඍණ
4. දක්ෂිණා
5. ඣෂ
6. ශිලා
7. ඍෂි
8. මුඛ
9. ඣම්පාක
10. ඍකාර
11. ඛර්ජූරක
12. කෘපණ

**භාවිතයට**

क्षणशः कणशश्चैव - विद्यामर्थं च साधयेत् ।
क्षणत्यागे कुतो विद्या - कणत्यागे कुतो धनम् ॥

මොහොතෙන් මොහොත ඉගෙනුම ද සතයෙන් සතය ධනය ද රැස් කරගන්නේ ය. මොහොතක් අත්හළොත් ඉගෙනුමක් කොයින් ද? සතයක් අත්හළොත් ධනයක් කොයින් ද?

04
පාඩම
චතුර්थः पाठः

# නාමපද හඳුනා ගනිමු

**නාමපදවල ලිංග හා වචන හඳුනා ගනිමු.**

පුද්ගලයකු, සතෙකු, ස්ථානයක්, ද්‍රව්‍යයක්, ආදිය හැඳින්වීමට යොදා ගන්නා සංඥා හෙවත් ශබ්දරූප නාම වශයෙන් හැඳින්වේ.

## පුද්ගලයෝ

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | नरः | (මිනිසා) | २ | बालकः | (ළමයා) |
| ३ | रथकारः | (රියදුරා) | ४ | भिक्षुः | (භික්ෂුව) |
| ५ | जनकः | (පියා) | ६ | पुत्रः | (පුතා) |
| ७ | जननी | (අම්මා) | ८ | गुरुः | (ගුරුවරයා) |
| ९ | दायकः | (දායකයා) | १० | शिष्यः | (සිසුවා) |

## සත්ත්වයෝ

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | शुनकः | (බල්ලා) | २ | बिडालः | (බළලා) |
| ३ | वृषभः | (ගොනා) | ४ | सर्पः | (සර්පයා) |
| ५ | मृगः | (මුවා) | ६ | गजः | (ඇතා) |
| ७ | सिंहः | (සිංහයා) | ८ | काकः | (කපුටා) |
| ९ | मत्स्यः | (මාළුවා) | १० | व्याघ्रः | (ව්‍යාඝ්‍රයා) |

## ස්ථාන

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | नगरम् | (නගරය) | २ | पर्णशाला | (පන්සල) |
| ३ | पाठशाला | (පාසල) | ४ | पुस्तकालयः | (පුස්තකාලය) |
| ५ | कूपः | (ළිඳ) | ६ | आवासम् | (ආවාසය) |
| ७ | गृहम् | (නිවස) | ८ | बुद्धमन्दिरम् | (බුද්ධ මන්දිරය) |
| ९ | मार्गः | (මාර්ගය) | १० | क्रीडांगनम् | (ක්‍රීඩාංගණය) |

## ද්‍රව්‍ය

| | | | | | |
|---|---|---|---|---|---|
| १ | वृक्षः | (ගස) | २ | आसनम् | (අසුන) |
| ३ | लता | (වැල) | ४ | उत्पीठिका | (මේසය) |
| ५ | पुष्पम् | (මල) | ६ | पुस्तकम् | (පොත) |
| ७ | पात्रम् | (පාත්‍රය) | ८ | चषकः | (කෝප්පය) |
| ९ | रथम् | (රථය) | १० | परिगणकम् | (පරිගණකය) |

### ලිංග

සංස්කෘත භාෂාවේ සියලු නාම ලිංග තුනකට අයත් වේ.

පුරුෂත්වය හෝ පුරුෂ ලක්ෂණ හඟවන ශබ්ද පුල්ලිංග වශයෙන් ද ස්ත්‍රීත්වය හෝ ස්ත්‍රී ලක්ෂණ හඟවන ශබ්ද ස්ත්‍රීලිංග වශයෙන් ද සැලකේ. එම ලිංග දෙකට අයත් නැති ශබ්ද නපුංසකලිංග වේ.

01. පුල්ලිංග - देव, मुनि, गुरु
02. ස්ත්‍රීලිංග - वनिता, मति, जननी
03. නපුංසකලිංග - फल, अस्थि, वस्तु

## වචන

සංස්කෘත භාෂාවේ සියලු නාම වරනැගීමේ දී වචන තුනකට අයත් වේ.

01. ඒකවචන - एकवचन
02. ද්විවචන - द्विवचन
03. බහුවචන - बहुवचन

### 4.1 අභ්‍යාසය

01. ඔබ දන්නා නාම පද 5ක් ලියන්න.

02. ඔබ දන්නා ඒ ඒ ලිංගවලට අයත් නාම පද 5 බැගින් ලියන්න.

03. පහත සඳහන් නාම ඊට යටින් ඇති වගුවෙහි ලා වර්ග කරන්න.

वृक्षः मृगः रथकारः गृहम्

नगरम् सर्पः पुष्पम् गुरुः

भिक्षुः आसनं मार्गः व्याघ्रः

| අංකය | පුද්ගලයෝ | සත්ත්වයෝ | ස්ථාන | ද්‍රව්‍ය |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |

භාවිතයට

अलसो मन्दबुद्धिश्च - सुखितो व्याधिपीडितः ।
निद्रालुः कामुकश्चेति षडेते शास्त्रवर्जिताः ॥

කම්මැලියා ද මඳ නුවණක් ඇත්තා ද සැප කැමැත්තා ද රෝගවලින් පෙළෙන්නා ද නිදිබහුල පුද්ගලයා ද කාමුකයා ද යන මේ සය දෙනා ඉගෙනුම බැහැර කළ අය වෙති.

05 පාඩම
पञ्चमः पाठः

# විභක්ති - 01
# (ප්‍රථමා විභක්තිය)

## ප්‍රථමා විභක්තිය

වාක්‍යයක ක්‍රියාවෙන් කියැවෙන, ප්‍රකාශවන පදය උක්තය වශයෙන් හැඳින්වේ. උක්තය ප්‍රථමා විභක්තියෙන් තැබේ.

| | | |
|---|---|---|
| कुमारः | → | लिखति |
| लेखकः | → | लिखति |
| आचार्यः | → | लिखति |

ඉහත සඳහන් වාක්‍ය තුනේ लिखति (ලියයි) යන ක්‍රියාව කරන්නා කර්තෘ ය. ඒ අනුව 'कुमारः, लेखकः, आचार्यः' යන නාම පද තුන ම කර්තෘවරු වෙත්. වරනැඟෙන්නේ ප්‍රථමා විභක්තියෙහි ය.

| | | |
|---|---|---|
| 1 | नृपः रक्षति । | (රජතුමා ආරක්ෂා කරයි.) |
| 2 | श्रामणेरः नमति । | (සාමණේරයන් වහන්සේ නමදියි.) |
| 3 | दायकः वन्दति । | (දායකයා වඳියි.) |
| 4 | बिडालः पिबति । | (බළලා බොයි.) |
| 5 | मूषिकः धावति । | (මීයා දුවයි.) |

නාමපදවල වචන භේදය හඳුනාගනිමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | नरः | (මිනිසා) | → | नराः | (මිනිස්සු) |
| 2 | लेखकः | (ලියන්නා) | → | लेखकाः | (ලියන්නෝ) |
| 3 | कर्षकः | (ගොවියා) | → | कर्षकाः | (ගොවියෝ) |
| 4 | हंसः | (හංසයා) | → | हंसाः | (හංසයෝ) |
| 5 | गायकः | (ගයන්නා ) | → | गायकाः | (ගයන්නෝ) |

## 5.1 ක්‍රියාකාරකම

අකාරාන්ත පුල්ලිංග बालक ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | बालकः | बालकौ | बालकाः |
| | ළමයා | ළමයි දෙදෙන | ළමයි |
| सम्बोधन | हे बालक | हे बालकौ | हे बालकाः |
| | පින්වත් ළමයා | පින්වත් ළමයි දෙදෙනානි | පින්වත් ළමයිනි |
| द्वितीया | बालकम् | बालकौ | बालकान् |
| | ළමයා | ළමයින් දෙදෙනා | ළමයින් |
| तृतीया | बालकेन | बालकाभ्याम् | बालकैः |
| | ළමයා විසින් | ළමයින් දෙදෙනා විසින් | ළමයින් විසින් |
| चतुर्थी | बालकाय | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාට | ළමයින් දෙදෙනාට | ළමයින්ට |
| पञ्चमी | बालकात् | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාගෙන් | ළමයින් දෙදෙනාගෙන් | ළමයින්ගෙන් |
| षष्ठी | बालकस्य | बालकयोः | बालकानाम् |
| | ළමයාගේ | ළමයින් දෙදෙනාගේ | ළමයින්ගේ |
| सप्तमी | बालके | बालकयोः | बालकेषु |
| | ළමයා කෙරෙහි | ළමයින් දෙදෙනා කෙරෙහි | ළමයින් කෙරෙහි |

## 5.2 ක්‍රියාකාරකම

बालक ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද පාඩම් කර වරනගමු.

नर - මිනිසා　　नृप - රජතුමා　　सचिव - ඇමති

आचार्य - ගුරුවරයා　　लेखक - ලේඛකයා　　जनाधिप - ජනපති

जनक - පියා　　अग्रज - අයියා　　अनुज - මල්ලී

| | | | | | |
|---|---|---|---|---|---|
| श्रमण | - භික්ෂුව | वाणिज | - වෙළෙන්දා | महाशय | - මහත්මයා |
| कर्षक | - ගොවියා | गोपाल | - ගොපල්ලා | दरिद्र | - දිළින්දා |
| भृत्य | - සේවකයා | पथिक | - මගියා | दारक | - ළදරුවා |
| अर्क | - ඉර | मेघ | - වලාකුළ | उटज | - පැල |
| व्रज | - ගාල | कासार | - විල | केदार | - කුඹුර |
| सारमेय | - බල්ලා | मार्जार | - බළලා | गर्दभ | - කොටළුවා |
| चित्रक | - කොටියා | वराह | - ඌරා | मर्कट | - රිළවා |
| मूषिक | - මීයා | शृगाल | - හිවලා | भल्लूक | - වලසා |
| शशक | - සාවා | वायस | - කවුඩා | बक | - කොකා |
| शकुन | - කුරුල්ලා | भृङ्ग | - මීමැස්සා | हंस | - හංසයා |
| मकरन्द | - මල්පැණි | मोदक | - රසකැවිල්ල | अपूप | - ආප්පය |
| गायक | - ගායකයා | | | | |

පුරුෂ තුනට අයත් උක්ත වශයෙන් යෙදෙන ප්‍රථමා විභක්තිපද පහත දැක්වේ.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथम पुरुष | सः | तौ | ते |
| | හෙතෙම | ඔවුහු දෙදෙනා | ඔවුහු |
| मध्यम पुरुष | त्वम् | युवाम् | यूयम् |
| | තුඹ | තුඹලා දෙදෙනා | තුඹලා |
| उत्तम पुरुष | अहम् | आवाम् | वयम् |
| | මම | අපි දෙදෙනා | අපි |

## 5.1 අභ්‍යාසය

1. बालक ශබ්දය ඇසුරෙන් ඔබ කැමති ශබ්ද දෙකක් වරනඟා දක්වන්න.

2. පහත දැක්වෙන ශබ්දවල හිස්තැනට අදාළ ප්‍රථමා විභක්තිපද දක්වන්න.

| | | | | |
|---|---|---|---|---|
| උදා: | नृप | - | प्रथमा बहुवचन | नृपाः |
| १ | वाणिज | - | प्रथमा द्विवचन | ........................ |
| २ | चन्द्र | - | प्रथमा एकवचन | ........................ |
| ३ | सचिव | - | प्रथमा बहुवचन | ........................ |
| ४ | शृगाल | - | प्रथमा द्विवचन | ........................ |
| ५ | मूषिक | - | प्रथमा एकवचन | ........................ |

## 5.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍යවල ඇති, ඒ ඒ පුරුෂවලට අයත් ප්‍රථමා විභක්තිපද පුරුෂ හා වචන වශයෙන් වෙන් කොට දක්වන්න.

| | |
|---|---|
| १ सः वदति। | ७ युवां हसथः। |
| २ वराहः खनति। | ८ आवां धावावः। |
| ३ अहं नमामि। | ९ ते पिबन्ति। |
| ४ तौ पचतः। | १० शकुनौ कूजतः। |
| ५ त्वं क्रीडसि। | ११ जनाधिपः आगच्छति। |
| ६ शिष्याः लिखन्ति। | १२ यूयम् इच्छथ। |

භාවිතයට

**अहिंसा परमो धर्मः - तथाहिंसा परो दमः।**
**अहिंसा परमं दानं - अहिंसा परमस्तपः॥**

අහිංසාව උතුම් ම දහම යි. එසේ ම අහිංසාව උතුම් හික්මීම යි.
අහිංසාව උතුම් දානය යි. අහිංසාව උතුම් තපස යි.

06
පාඩම
षष्ठः पाठः

# නාම විශේෂණ

सः - මෙහෙතෙම

बालकः ළමයා

सः बालकः - ඒ ළමයා

ඉහත නිදර්ශනයට අනුව පහත සඳහන් නාම විශේෂණ ඉගෙන ගන්න.

| | |
|---|---|
| सः शिष्यः । | (ඒ ශිෂ්‍යයා) |
| सः काकः । | (ඒ කපුටා) |
| सः भिक्षुः । | (ඒ භික්ෂුව) |
| सः आचार्यः । | (ඒ ගුරුතුමා) |
| सः सूर्यः । | (ඒ සූර්යයා) |

ते - ඔවුහු

बालकाः - (ළමයි)

ते बालकाः - (ඒ ළමයි)

| | |
|---|---|
| ते अमात्याः | (ඒ ඇමතිවරු) |
| ते गायकाः | (ඒ ගායකයෝ) |
| ते भकाः | (ඒ කොක්කු) |
| ते शुनकाः | (ඒ බල්ලෝ) |
| ते वानराः | (ඒ වඳුරෝ) |

तुंगः - උස

वृक्षः (ගස)

तुंगः वृक्षः - උස ගස

सः හා ते යනු तत् යන සර්වනාමයේ ඒකවචන හා බහුවචන රූපයෝ වෙති. ඉහත සඳහන් නිදර්ශනයන්ට අනුව පහත සඳහන් නාම විශේෂණ උගනිමු.

| | |
|---|---|
| दक्षः शिष्यः | (දක්ෂ ශිෂ්‍යයා) |
| रक्तः विहङ्गः | (රතු කුරුල්ලා) |
| श्वेतः चन्द्रः | (සුදු සඳ) |
| दीर्घः सर्पः | (දිග සර්පයා) |
| प्रणीतः मोदकः | (ප්‍රණීත රස කැවිල්ල) |

මෙම විශේෂණපද නාමපදයේ (විශේෂ්‍ය පදයේ) ලිංග ගනී. නාමපද අනුව විශේෂණපද ලිංග ගන්නා අයුරු පහත සඳහන් උදාහරණ මගින් ඉගෙන ගන්න.

නිදසුන් :

| | | |
|---|---|---|
| පුරුෂ ලිංග | १ गम्भीरः समुद्रः । | ගැඹුරු මුහුද |
| | २ कृष्णः मार्जारः । | කළු බළලා |
| | ३ विशालः पर्वतः । | විශාල පර්වතය |
| | ४ जर्जरः शकटः । | දිරූ කරත්තය |
| | ५ रमणीयः कासारः । | සිත්කලු විල |
| | ६ सुन्दरः हंसः । | සුන්දර හංසයා |
| ස්ත්‍රී ලිංග | १ गम्भीरा गङ्गा । | ගැඹුරු ගංගාව |
| | २ कृष्णा शिला । | කළු ගල |
| | ३ विशाला नौका । | විශාල නැව |
| | ४ जर्जरा शाखा । | දිරූ අත්ත |
| | ५ रमणीया तारका । | සිත්කලු තරුව |
| | ६ सुन्दरा प्रतिमा । | සුන්දර පිළිමය |
| නපුංසක ලිංග | १ गम्भीरं भाजनं । | ගැඹුරු භාජනය |
| | २ कृष्णं छत्रं । | කළු කුඩය |
| | ३ विशालं आपणं । | විශාල කඩය |
| | ४ जर्जरं शकटं । | දිරූ |
| | ५ रमणीयं उद्यानं । | සිත්කලු උයන |
| | ६ सुन्दरं पुष्पं । | සුන්දර මල |

## 6.1 අභ්‍යාසය

පහත දැක්වෙන වරහන් තුළ ඇති සුදුසු වචන තෝරා හිස්තැන් පුරවන්න.

१ ..................... वायसः ।
२ ..................... वृक्षः ।
३ ..................... छात्रः ।
४ ..................... भूषणं ।
५ ..................... फलं ।
६ ..................... सूर्यः ।
७ ..................... बकः ।
८ ..................... भोजनं ।
९ ..................... बालिका ।
१० ..................... माला ।
११ ..................... वानराः ।
१२ ..................... धर्मशाला

(विशाला, मधुरं, विचित्रा, रक्तः, पक्वं, ते, रमणीयं, सः, कृष्णः, दुर्विनीता, तुङ्गः, काणः)

**සංඛ්‍යා ද විශේෂණ** වශයෙන් යෙදිය හැකිය.

උදා:-

| शब्द | पुरुषलिङ्ग | स्त्रीलिङ्ग | नपुंसकलिङ्ग |
|---|---|---|---|
| एक | एकः | एका | एकम् |
| | एकः बालकः | एका बालिका | एकं पुस्तकं |
| | एकः उपासकः | एका उपासिका | एकं पद्मं |
| | एकः पुत्रः | एका तनुजा | एकं लेखनं |

## 6.2 අභ්‍යාසය

පහත දැක්වෙන විශේෂණ තුනෙන් හිස්තැන් පුරවන්න.

एकः एका एकम्

१. .............................. वृक्षः ।
२. .............................. ग्रामम् ।
३. .............................. जनकः ।
४. .............................. माला ।
५ .............................. लता ।
६. .............................. शाला ।
७. .............................. फलम् ।
८. .............................. सारमेयः ।
९. .............................. वानरः ।
१०. .............................. गृहम् ।

## 6.1 ක්‍රියාකාරකම

පහත සඳහන් විශේෂණ පද උගනිමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| रक्त | - රතු | तुङ्ग | - උස් | विचित्र | - විසිතුරු |
| श्वेत | - සුදු | दीर्घ | - දික් | सुन्दर | - සුන්දර |
| नील | - නිල් | दक्ष | - දක්ෂ | रमणीय | - සිත්කලු |
| पीत | - කහ | भीम | - බියකරු | दुर्गम | - රළු (දුෂ්කර) |
| हरित | - කොළ | मधुर | - මිහිරි | कृश | - කෙට්ටු |
| कृष्ण | - කළු | जर्जर | - දිරූ | दुर्विनीत | - නොහික්මුණු |
| तीक्ष्ण | - තියුණු | काण | - කණ | दुर्बल | - දුබල |
| पक्व | - පැසුණු | गम्भीर | - ගැඹුරු | कल्याण | - යහපත් |
| प्रणीत | - රසවත් | शोभन | - රූමත් | प्रशान्त | - සන්සුන් |

භාවිතයට

विद्वत्वं च नृपत्वं च नैव  तुल्यं कदाचन।
स्वदेशे पूज्यते राजा विद्वान् सर्वत्र पूज्यते॥

උගත්කම ද රජකම ද කිසිවිටෙකත් සමාන නොවන්නේ ය. රජ සියරටෙහි දී රජ පුදනු ලැබේ. උගතා සියලු තන්හි පුදනු ලැබේ.

07
පාඩම
सप्तमः पाठः

# වර්තමානකාල ක්‍රියාපද

වර්තමාන කාලය - වර්තමාන 'ලට්'

## 7.1 ක්‍රියාකාරකම

වර්තමාන ප්‍රත්‍යයමාලාව වාචෝද්ගත කරමු.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | ति | तः | न्ति |
| मध्यमपुरुष | सि | थः | थ |
| उत्तमपुरुष | मि | वः | मः |

## 7.2 ක්‍රියාකාරකම

√नम् ධාතුවේ अ විකරණය සහිත වර්තමාන ක්‍රියා වාචෝද්ගත කරමු.

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | नमति | नमतः | नमन्ति |
| | වඳියි | (දෙදෙන) වඳිත් | වඳිති |
| मध्यमपुरुष | नमसि | नमथः | नमथ |
| | වඳිහි | (දෙදෙන) වඳිහු | වඳිහු |
| उत्तमपुरुष | नमामि | नमावः | नमामः |
| | වඳිමි | (දෙදෙන) වඳිමු | වඳිමු |

## 7.3 ක්‍රියාකරකම

**පහත දැක්වෙන ක්‍රියාපද වර්තමාන ලට් ලකාර පරස්මෛ පදයෙහි වරනගන්න.**

| | | | | | |
|---|---|---|---|---|---|
| नमति | - නමදියි | पचति | - පිසයි | व्रजति | - යයි |
| लालयति | - නළවයි | चरति | - හැසිරෙයි | इच्छति | - කැමති වෙයි |
| खनति | - කනී | धावति | - දුවයි | राजति | - බබළයි |
| वदति | - කියයි | वपति | - වපුරයි | वहति | - උසුලයි |
| रोदिति | - අඬයි | गायति | - ගයයි | त्रस्यति | - තැතිගනී |
| ताडयति | - තළයි | कूजति | - නාද කරයි | उपदिशति | - උගන්වයි |
| उपविशति | - හිඳගනී | कर्षति | - සීසායි | तर्कयति | - විමසයි |
| हरति | - ගෙනයයි | आहरति | - ගෙන එයි | देशयति | - දෙසයි |
| जयति | - දිනයි | म्लायति | - මැලවෙයි | तुष्यति | - සතුටු වෙයි |

**නාමපද, ක්‍රියාපද පමණක් ඇතුළත් සරල වාක්‍ය ඉගෙන ගන්න.**

| | | | |
|---|---|---|---|
| प्रथम पुरुष | सः | नमति। | හෙතෙම වඳියි. |
| | तौ | नमतः। | ඔවුහු දෙදෙන වඳිත්. |
| | ते | नमन्ति। | ඔවුහු වඳිති. |
| मध्यम पुरुष | त्वं | नमसि। | තුඹ/තෝ වඳිහි. |
| | युवाम् | नमथः। | තුඹලා දෙදෙන/තොපි දෙදෙනා වඳිහු. |
| | यूयम् | नमथ। | තුඹලා/තොපි වඳිහු. |
| उत्तम पुरुष | अहम् | नमामि। | මම වඳිමි. |
| | आवाम् | नमावः। | අපි දෙදෙන වඳිමු. |
| | वयम् | नमामः। | අපි වඳිමු. |

## 7.1 අභ්‍යාසය

01. ඔබ කැමති ක්‍රියාපද 3ක් වර්තමාන 'ලට්' ලකාරයේ වරනඟන්න.

02. පහත සඳහන් වාක්‍ය සිංහලයට නඟන්න.

| | |
|---|---|
| १ अर्कः उदेति । | ६ यूयं व्रजथ । |
| २ जनाधिपः जयति । | ७ गोपालाः हरन्ति । |
| ३ सचिवाः तर्कयन्ति । | ८ शुनकौ धावतः । |
| ४ अहं नमामि । | ९ कर्षकाः कर्षन्ति । |
| ५ वयं पठामः । | १० तौ ताडयतः । |

## 7.2 අභ්‍යාසය

01. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

| | |
|---|---|
| 1. කුරුල්ලෝ නාදකරති. | 6. ඔවුහු හැසිරෙති. |
| 2. පියා සතුටු වෙයි. | 7. සාමණේර හිමිවරු පාඩම් කරති. |
| 3. ළදරුවා හිඳ ගනියි. | 8. ගොවියෝ දෙදෙන වපුරත්. |
| 4. නුඹ ගයහි. | 9. නුඹලා දෙදෙන යහු. |
| 5. ගුරුවරු උගන්වති. | 10. මම ලියමි. |

02. පහත සඳහන් වාක්‍යවල හිස්තැනට අදාළ පද යොදා නැවත ලියන්න.

1 चित्रकः ...........................

2 ........................... रोदिति ।

3 मर्कटाः ...........................

4 पथिकौ ...........................

5 ........................... धावन्ति ।

**භාවිතයට**

**धर्मो जयति नाधर्मः - सत्यं जयति नानृतम् ।**
**क्षमा जयति न क्रोधो - देवो जयति नासुरः ॥**

ධර්මය දිනයි. අධර්මය නො දිනයි. සත්‍යය දිනයි. අසත්‍යය නො දිනයි.
ඉවසීම දිනයි. ක්‍රෝධය නො දිනයි. දෙවියා දිනයි. අසුරයා නො දිනයි.

08
පාඩම
अष्टमः पाठः

# විභක්ති - II
## (සම්බෝධන විභක්තිය)

**වරනැගීම**

**8.1 ක්‍රියාකාරකම**

ඉකාරාන්ත පුරුෂලිංග कवि ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | कविः | कवी | कवयः |
| | කවියා | කවියෝ දෙදෙන | කවියෝ |
| सम्बोधन | हे कवे | हे कवी | हे कवयः |
| | කවියාණෙනි | කවියෝ දෙදෙනනි | කවියනි |
| द्वितीया | कविम् | कवी | कवीन् |
| | කවියා | කවියන් දෙදෙනා | කවියන් |
| तृतीया | कविना | कविभ्याम् | कविभिः |
| | කවියා විසින් | කවියන් දෙදෙනා විසින් | කවියන් විසින් |
| चतुर्थी | कवये | कविभ्याम् | कविभ्यः |
| | කවියාට | කවියන් දෙදෙනාට | කවියන්ට |
| पञ्चमी | कवेः | कविभ्याम् | कविभ्यः |
| | කවියාගෙන් | කවියන් දෙදෙනාගෙන් | කවියන්ගෙන් |
| षष्ठी | कवेः | कव्योः | कवीनाम् |
| | කවියාගේ | කවියන් දෙදෙනාගේ | කවියන්ගේ |
| सप्तमी | कवौ | कव्योः | कविषु |
| | කවියා කෙරෙහි | කවියන් දෙදෙනා කෙරෙහි | කවියන් කෙරෙහි |

## සම්බෝධන විභක්තිය හෙවත් ආලපන

कुमारः - කුමාරයා

हे कुमार - පින්වත් කුමාරයනි

උදා:

हे कुमार - කුමාරය,
हे कुमारौ - කුමාරයෝ දෙදෙනෙනි,
हे कुमाराः - කුමාරවරුනි,

දැන් ආමන්ත්‍රණය සමග යෙදෙන විධාන ක්‍රියාව පිළිබඳ ව විමසා බලමු.

| වර්තමාන ඒකවචන ක්‍රියාව | විධාන ක්‍රියාව | | |
|---|---|---|---|
| | एकवचन | द्विवचन | बहुवचन |
| पचति | पच | पचतम् | पचत |
| උයයි | උයව/උයන්න | දෙදෙන උයවු | උයවු |
| धावति | धाव | धावतम् | धावत |
| දුවයි | දුවව/ දුවන්න | දෙදෙන දුවවු | දුවවු |
| गायति | गाय | गायतम् | गायत |
| ගයයි | ගයව/ ගයන්න | දෙදෙන ගයවු | ගයවු |
| तिष्ठति | तिष्ठ | तिष्ठतम् | तिष्ठत |
| සිටියි | සිටුව/ සිටින්න | දෙදෙන සිටිවු | සිටිවු |

දැන් ආමන්ත්‍රණය සමග විධාන ක්‍රියාව යෙදෙන වාක්‍ය කිහිපයක් උගනිමු.

हे श्रामणेर, आगच्छ । - සාමණේරයන් වහන්ස, වඩින්න.

हे छात्रौ, पठतम् । - ශිෂ්‍යයෝ දෙදෙනෙනි, පාඩම් කරන්න.

हे बालकाः, क्रीडत । - ළමයිනි, සෙල්ලම් කරන්න.

## අවධානයට

අන්ත වශයෙන් (අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත) වෙනස් ව වරනැඟෙන බොහෝ ශබ්දවල ප්‍රථමාවට වඩා සම්බෝධන ඒකවචනයේ වෙනසක් ඇත. පහත නිදසුන් දෙස හොඳින් අවධානය යොමු කරන්න.

| शब्द | प्रथमा एकवचन | सम्बोधन एकवचन |
|---|---|---|
| कुमार | कुमारः | हे कुमार |
| कपि | कपिः | हे कपे |
| गुरु | गुरुः | हे गुरो |
| पितृ | पिता | हे पितः |

## 8.2 ක්‍රියාකාරකම

කවි ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද පාඩම් කර වරනගමු.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| अग्नि | - | ගින්න | अरि | - | සතුරා | आदि | - | ආරම්භය |
| ऋषि | - | ඍෂිවරයා | गिरि | - | කන්ද | उदधि | - | සාගරය |
| नृपति | - | රජතුමා | विधि | - | විධානය | द्युमणि | - | හිරු |
| राशि | - | රැස | गीर्पति | - | බ්‍රහස්පති | निशापति | - | සඳු |
| सौरि | - | සෙනසුරා | निधि | - | නිධානය | छेदि | - | වඩුවා |
| ग्रहि | - | ළිඳ | व्याधि | - | ලෙඩ | सारथि | - | රියදුරා |
| घोटारि | - | මීමා | इभारि | - | සිංහයා | अहि | - | සර්පයා |
| ज्ञाति | - | නෑයා | बलि | - | පූජාව | | | |

## 8.1 අභ්‍යාසය

පහත සඳහන් නාමවල සම්බෝධන රූප දක්වන්න.

| | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| नृप | ................. | ................. | ................. |
| मेघ | ................. | ................. | ................. |
| रवि | ................. | ................. | ................. |
| अरि | ................. | ................. | ................. |
| शिशु | ................. | ................. | ................. |

## 8.2 අභ්‍යාසය

පහත දැක්වෙන වර්තමානකාල ක්‍රියාපදවලින් විධානක්‍රියා සාදන්න.

| | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| උදා:- | वदति | वद् | वदतम् | वदत |
| | १ नमति | .................. | .................. | .................. |
| | २ पठति | .................. | .................. | .................. |
| | ३ नयति | .................. | .................. | .................. |
| | ४ जयति | .................. | .................. | .................. |
| | ५ गच्छति | .................. | .................. | .................. |

## 8.3 අභ්‍යාසය

පහත සඳහන් වර්තමාන ක්‍රියා ඇසුරින් විධාන ක්‍රියාව සාද තේරුම ලියන්න.

| | වර්තමාන ක්‍රියා | වචනය | | තේරුම |
|---|---|---|---|---|
| උදා:- | हसति | (विधान एकवचन) | हस | .................. |
| | १ खादति | (विधान द्विवचन) | .................. | .................. |
| | २ पिबति | (विधान बहुवचन) | .................. | .................. |
| | ३ यच्छति | (विधान एकवचन) | .................. | .................. |
| | ४ शयति | (विधान द्विवचन) | .................. | .................. |
| | ५ पश्यति | (विधान बहुवचन) | .................. | .................. |

## 8.4 අභ්‍යාසය

පහත සඳහන් වාක්‍ය සිංහලයට නඟන්න.

१ हे बालक, धाव ।

२ हे पुत्र, आगच्छ ।

३ हे अरी, तिष्ठतम् ।

४ हे श्रमणाः, देशय ।

५ हे शकुनौ, कूजतम् ।

६ हे सेनापतयः, जयत ।

७ हे चोर, त्वं तिष्ठ ।

८ हे बालकाः, यूयं लिखत ।

९ हे यते, उपादिश ।

१० हे सारथी, युवां नयतम् ।

## 8.5 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නගන්න.

1. ශිෂ්‍යය, පාඩම් කරන්න.
2. ශෝවියනි, සීසාවු.
3. දරුවනි, නැගිටිවු.
4. ගායකයෝ දෙදෙනෙනි, ගයවු.
5. රජතුමනි, රකින්න.
6. පුත්තු දෙදෙනෙනි, ක්‍රීඩා කරවු.
7. ලේඛකයෝ දෙදෙනෙනි, තුඹලා දෙදෙන ලියවු.

හාවිතයට

त्यज दुर्जनसंसर्गं भज साधुसमागमम् ।
कुरु पुण्यमहोरात्रं स्मर नित्यमनित्यताम् ॥

දුදන ඇසුර අත්හරින්න. සුදනන් හා එකතු වන්න.
දිවා රැයේ පින් කරන්න. අනියත බව නිති සිහි කරන්න.

09
පාඩම
नवमः पाठः

# විභක්ති - III
## (ද්විතීයා විභක්තිය)

**ද්විතීයා විභක්තිය**

१ बालकः बुद्धं वन्दति। - ළමයා බුදුරජාණන් වහන්සේ වදියි.

२ सारथिः रथं नयति। - රියැදුරා රථය පදවයි.

३ मुनिः गिरिम् आरोहति। - මුනිතෙම කන්ද නගියි.

**වරනැගීම**

### 9.1 ක්‍රියාකාරකම

උකාරාන්ත පුල්ලිංග साधु ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | साधुः | साधू | साधवः |
| | සත්පුරුෂයා | සත්පුරුෂයෝ දෙදෙන | සත්පුරුෂයෝ |
| सम्बोधन | हे साधो | हे साधू | हे साधवः |
| | පින්වත් සත්පුරුෂය | පින්වත් සත්පුරුෂයෝ දෙදෙනානි | පින්වත් සත්පුරුෂයනි |
| द्वितीया | साधुम् | साधू | साधून् |
| | සත්පුරුෂයා | සත්පුරුෂයන් දෙදෙනා | සත්පුරුෂයන් |
| तृतीया | साधुना | साधुभ्याम् | साधुभिः |
| | සත්පුරුෂයා විසින් | සත්පුරුෂයන් දෙදෙනා විසින් | සත්පුරුෂයන් විසින් |

| | | | |
|---|---|---|---|
| चतुर्थी | साधवे | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාට | සත්පුරුෂයන් දෙදෙනාට | සත්පුරුෂයන්ට |
| पञ्चमी | साधोः | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාගෙන් | සත්පුරුෂයන් දෙදෙනාගෙන් | සත්පුරුෂයන්ගෙන් |
| षष्ठी | साधोः | साध्वोः | साधूणाम् |
| | සත්පුරුෂයාගේ | සත්පුරුෂයන් දෙදෙනාගේ | සත්පුරුෂයන්ගේ |
| सप्तमी | साधौ | साध्वोः | साधुषु |
| | සත්පුරුෂයා කෙරෙහි | සත්පුරුෂයන් දෙදෙනා කෙරෙහි | සත්පුරුෂයන් කෙරෙහි |

## 9.2 ක්‍රියාකාරකම

साधु ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද වරනඟමු.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| गुरु | - | ගුරුවරයා | शिशु | - | සිසුවා | सूनु | - | පුතා |
| बन्धु | - | නෑයා | अन्धु | - | ළිඳ | इन्दु | - | සඳ |
| विधु | - | සඳ | स्थाणु | - | කණුව | भीरु | - | බියගුල්ලා |
| शत्रु | - | සතුරා | भानु | - | හිරු | वायु | - | සුළඟ |
| इषु | - | හීය | दयालु | - | දයා ඇත්තා | जन्तु | - | සත්ත්වයා |
| शङ्कु | - | උල | सिन्धु | - | මුහුද | पटु | - | දක්ෂයා |
| हेतु | - | කාරණය | तन्तु | - | නූල /කෙන්ද | सानु | - | සානුව |

अलङ्करिष्णु - අලංකාර කරන්නා

## 9.1 අභ්‍යාසය

පහත සඳහන් උක්ත පදවල (ප්‍රථමා විභක්ති පදවල) අනුක්ත රූප (ද්විතීයා විභක්ති පද) දක්වන්න.

१ सूनुः .............................. २ भिक्षवः ..............................

३ तरू .............................. ४ शृगालः ..............................

५ अली .............................. ६ धनिकाः ..............................

७ जन्तवः .............................. ८ नृपतयः ..............................

९ दासाः .............................. १० शत्रू ..............................

## 9.2 අභ්‍යාසය

පහත සඳහන් අනුක්ත පදවල (ද්විතීයා විභක්ති පදවල) උක්ත රූප (ප්‍රථමා විභක්ති පද) දක්වා තේරුම් ලියන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| १ नृपान् | ............ | ............ | ६ वानरौ | ............ | ............ |
| २ हंसौ | ............ | ............ | ७ गोपालम् | ............ | ............ |
| ३ अरी | ............ | ............ | ८ बन्धून् | ............ | ............ |
| ४ गुरून् | ............ | ............ | ९ असीन् | ............ | ............ |
| ५ दयालुम् | ............ | ............ | १० सिन्धुम् | ............ | ............ |

## 9.3 අභ්‍යාසය

1. පහත සඳහන් වාක්‍ය සිංහලයට නගන්න.

१ सूनुः इन्दुं पश्यति ।
२ बालकः जनकं बन्दति ।
३ नृपतिः अरिं जयति ।
४ कृषीबलः उटजं गच्छति ।
५ छात्रौ भिक्षुं नमतः ।
६ हे शिशो, गुरुं नम।
७ दरिद्रः ओदनं याचति ।
८ सेनापतयः असीन् आनयन्ति ।
९ कपी तरू आरोहतः ।
१० साधवः धर्मम् उपदिशन्ति ।
११ नाविकाः सिन्धुं गच्छन्ति ।
१२ हे बन्धवः गृहम् आगच्छत।

2. පහත සඳහන් වාක්‍ය සංස්කෘතයට නගන්න.

1. ළමයි ගෙදර යති.
2. අපි පන්සලට යමු.
3. මම සඳ බලමි.
4. ශිෂ්‍යයෝ පාසලට යති.
5. අපි සත්පුරුෂයෝ වෙමු.
6. පියා පුතු රකියි.
7. කවිවරු දෙදෙන මුනිවරුන් පසසත්.
8. ඇමැතිවරු ගමට එති.
9. සෙබළු යුද්ධය දිනති.
10. යතිවරු දෙදෙනා ආරාමයට පැමිණෙත්.

### භාවිතයට

**मत्स्याश्च जलमिच्छन्ति - धनमिच्छन्ति वाणिजाः ।**
**नीचाः कलहमिच्छन्ति - धर्ममिच्छन्ति पण्डिताः ॥**

මාළුවෝ දියට කැමැති වෙති. වෙළෙන්දෝ ධනයට කැමැති වෙති. අධමයෝ කලහයට කැමැති වෙති. බුද්ධිමත්හු දහමට කැමැති වෙති.

10 පාඩම
දශමඃ පාඨඃ

# විභක්ති - IV
## (තෘතීයා විභක්තිය)

තෘතීයා විභක්තිය - වරනැඟෙන අයුරු

තෘතීයා විභක්තියේ වරනැඟීම් පහත සඳහන් අයුරින් උගනිමු.

| शब्द | | विभक्ति | एक | द्वि | बहु |
|---|---|---|---|---|---|
| गज | උක්ත කර්තෘපද | प्रथमा | गजः | गजौ | गजाः |
| | | | ඇතා | ඇත්තු දෙදෙන | ඇත්තු |
| | අනුක්ත කර්තෘපද | तृतीया | गजेन | गजाभ्याम् | गजैः |
| | | | ඇතා විසින් | ඇතුන් දෙදෙනා විසින් | ඇතුන් විසින් |
| मुनि | උක්ත කර්තෘපද | प्रथमा | मुनिः | मुनी | मुनयः |
| | | | මුනිවරයා | මුනිවරු දෙදෙන | මුනිවරු |
| | අනුක්ත කර්තෘපද | तृतीया | मुनिना | मुनिभ्याम् | मुनिभिः |
| | | | මුනිවරයා විසින් | මුනිවරුන් දෙදෙනා විසින් | මුනිවරුන් විසින් |
| गुरु | උක්ත කර්තෘපද | प्रथमा | गुरुः | गुरू | गुरवः |
| | | | ගුරුවරයා | ගුරුවරු දෙදෙන | ගුරුවරු |
| | අනුක්ත කර්තෘපද | तृतीया | गुरुणा | गुरुभ्याम् | गुरुभिः |
| | | | ගුරුවරයා විසින් | ගුරුවරුන් දෙදෙනා විසින් | ගුරුවරුන් විසින් |

## 10.3 ක්‍රියාකාරකම

පහත සඳහන් ක්‍රියාපද හඳුනාගන්න.

කර්තෘකාරක ක්‍රියා

लिखति - ලියයි
पठति - පාඩම් කරයි
नमति - වඳියි
पचति - පිසයි
रक्षति - රකියි
खनति - සාරයි
ताडयति - තළයි
त्यजति - අත්හරියි
याचति - ඉල්ලයි
नदति - නාද කරයි
कथयति - කියයි
रचयति - රචනා කරයි
पूजयति - පුදයි
दहति - දවයි
पुष्यति - පෝෂණය කරයි
पिबति - බොයි
नयति - ගෙන යයි
कर्षति - සීසායි
गायति - ගයයි

## 10.4 ක්‍රියාකාරකම

අකාරාන්ත නපුංසකලිංග පුෂ්ප ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | पुष्पं | पुष्पे | पुष्पाणि |
| | මල | මල් දෙක | මල් |
| सम्बोधन | हे पुष्प | हे पुष्पे | हे पुष्पाणि |
| | එම්බා මල | එම්බා මල් දෙක | එම්බා මල් |
| द्वितीया | पुष्पं | पुष्पे | पुष्पाणि |
| | මල | මල් දෙක | මල් |
| तृतीया | पुष्पेण | पुष्पाभ्याम् | पुष्पैः |
| | මලින් | මල් දෙකෙන් | මල්වලින් |
| चतुर्थी | पुष्पाय | पुष्पाभ्याम् | पुष्पेभ्यः |
| | මලට | මල්දෙකට | මල්වලට |
| पञ्चमी | पुष्पात् | पुष्पाभ्याम् | पुष्पेभ्यः |
| | මලෙන් | මල් දෙකෙන් | මල්වලින් |
| षष्ठी | पुष्पस्य | पुष्पयोः | पुष्पाणाम् |
| | මලේ | මල් දෙකේ | මල්වල |
| सप्तमी | पुष्पे | पुष्पयोः | पुष्पेषु |
| | මලෙහි | මල් දෙකෙහි | මල්වල |

## 10.5 ක්‍රියාකාරකම

නපුංසකලිංග පුෂ්ප ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද පාඩම් කර වරනඟමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| पुस्तक | - පොත | लेखन | - ලියුම | आपण | - කඩය |
| खनित्र | - උදැල්ල | छत्र | - කුඩය | भाण्ड | - බඩු |
| उदक | - ජලය | पद्म | - නෙලුම | पुष्प | - මල |
| भाजन | - භාජනය | भोजन | - ආහාර | छिद्र | - සිදුර |
| उटज | - පැල | गोष्ठ | - ගාල | स्थान | - තැන |
| वस्त्र | - වස්ත්‍රය | पर्ण | - කොළය | मूल्य | - මුදල් |
| काष्ठ | - දර | भक्त | - බත් | भूषण | - ආභරණ |
| नयन | - ඇස | घ्राण | - නාසය | पीठ | - පුටුව |
| चिबुक | - නිකට | वक्त्र | - මුහුණ | हृदय | - හදවත |
| गृह | - ගෙය | वातायन | - ජනේලය | क्रीडाङ्गण | - ක්‍රීඩාපිටිය |
| द्विचक्र | - පාපැදිය | शकट | - කරත්තය | गगनयान | - ගුවන්යානය |

## 10.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ප්‍රථමා විභක්ති පද තෘතීයා විභක්ති පදවලට හරවා තේරුම් ලියන්න.

१ अनुजः - .............................. ..............................
२ चित्रकौ - .............................. ..............................
३ वाणिजाः - .............................. ..............................
४ सारथिः - .............................. ..............................
४ जनकः - .............................. ..............................
५ अरी - .............................. ..............................
६ कपयः - .............................. ..............................
७ गुरुः - .............................. ..............................
८ शिशू - .............................. ..............................
९ साधवः - .............................. ..............................

2. පහත දැක්වෙන තෘතීයා විභක්ති පද ප්‍රථමා විභක්ති පදවලට හරවා තේරුම් ලියන්න.

१ जनकेन - .................................. ..................................
२ लेखकाभ्याम् - .................................. ..................................
३ मूषिकेन - .................................. ..................................
४ नृपतिना - .................................. ..................................
५ अहिभ्याम् - .................................. ..................................
६ छेदिभिः - .................................. ..................................
७ शत्रुणा - .................................. ..................................
८ बन्धुभ्याम् - .................................. ..................................
९ कविभिः - .................................. ..................................

භාවිතයට

**अर्थवान् न कुलीनोऽपि लोकेन पूज्यते नरः ।**
**शशिनस्तुल्यवंशोऽपि निर्धनः परिभूयते ॥**

කුලවත් නො වුව ද ධනය ඇති මිනිසා ලොවැස්සා විසින් පුදනු ලැබේ. (පිරිසිදු බවින්) සඳු හා සමාන කුලවතෙකු වුව ද ධනය නැත්තේ නම් ලෝකයා විසින් පහළා දකිනු ලැබේ.

**अजरामरवत् प्राज्ञो विद्यामर्थं च चिन्तयेत् ।**
**गृहीत इव केशेषु मृत्युना धर्ममाचरेत् ॥**

(කිසිදා) නොදිරන, නොමැරෙන කෙනකු සේ ඉගෙනීම හා ධන සම්පත් සෙවීම ගැන සිතිය යුත්තේ ය. එහෙත් මාරයා විසින් කෙස්වැටියෙන් අල්ලාගත්තා ලද්දකු මෙන් ධර්මයෙහි හැසිරිය යුත්තේ ය.

11
පාඩම
एकादशः पाठः

# තෘතීයා ප්‍රයෝග

## තෘතීයා විභක්ති ප්‍රයෝග

| | | |
|---|---|---|
| हस्त = අත | हस्तेन = | අතින්/<br>අතේ උපකාරයෙන්/<br>අතේ උදව්වෙන්/<br>අත කරණ කොටගෙන |

උදා: अहं हस्तेन लिखामि। - මම අතින් ලියමි.
अम्बा अग्निना ओदनं पचति। - අම්මා ගින්නෙන් බත පිසයි.
सुमेधः नेत्राभ्यां पश्यति। - සුමේධ දෑසින් බලයි.

| | | |
|---|---|---|
| अनुज = මල්ලි | अनुजेन सह<br>अनुजेन सार्धम् | මල්ලි සමඟ |

උදා:
अग्रजः अनुजेन सह क्रीडति।
අයියා මල්ලී සමඟ සෙල්ලම් කරයි.

आचार्यः शिष्येन सार्धं पाठालयं गच्छति।
ගුරුවරයා ශිෂ්‍යයා සමඟ පාසලට යයි.

भिक्षुः दायकैः सार्धं संलपति।
භික්ෂුව දායකයන් සමඟ පිළිසඳරේ යෙදෙයි.

## වරනැඟීම

### 11.1 ක්‍රියාකාරකම

ඍකාරාන්ත පුල්ලිංග पितृ ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | पिता | पितरौ | पितरः |
| | පියා | පියවරු දෙදෙන | පියවරු |
| सम्बोधन | हे पितः | हे पितरौ | हे पितरः |
| | පින්වත් පියතුමනි | පින්වත් පියවරු දෙදෙනානි | පින්වත් පියවරුනි |
| द्वितीया | पितरम् | पितरौ | पितॄन् |
| | පියා | පියවරුන් දෙදෙන | පියවරුන් |
| तृतीया | पित्रा | पितृभ्याम् | पितृभिः |
| | පියා විසින් | පියවරුන් දෙදෙනා විසින් | පියවරුන් විසින් |
| चतुर्थी | पित्रे | पितृभ्याम् | पितृभ्यः |
| | පියාට | පියවරුන් දෙදෙනාට | පියවරුන්ට |
| पञ्चमी | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| | පියාගෙන් | පියවරුන් දෙදෙනාගෙන් | පියවරුන්ගෙන් |
| षष्ठी | पितुः | पित्रोः | पितॄणाम् |
| | පියාගේ | පියවරුන් දෙදෙනාගේ | පියවරුන්ගේ |
| सप्तमी | पितरि | पित्रोः | पितृषु |
| | පියා කෙරෙහි | පියවරුන් දෙදෙනා කෙරෙහි | පියවරුන් කෙරෙහි |

## 11.2 ක්‍රියාකාරකම

පුල්ලිංග पितृ ශබ්දයට සමාන පහත දක්වෙන ශබ්ද පාඩම් කර වරනඟමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| जामातृ | - | බෑනා | भ्रातृ | - | සොහොයුරා |
| देवृ | - | මස්සිනා | नृ | - | මිනිසා |

### අවධානයට

පහත දැක්වෙන ශබ්ද ප්‍රථමා, සම්බෝධන, ද්විතීයා විභක්තිවල පමණක් තරමක් වෙනස් ව වරනැඟේ.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | गन्ता | गन्तारौ | गन्तारः |
| सम्बोधन | हे गन्तः | हे गन्तारौ | हे गन्तारः |
| द्वितीया | गन्तारम् | गन्तारौ | गन्तॄन् |

සෙසු විභක්තිවල पितृ ශබ්දයට සමාන ව වරනැඟේ

| | | | | | |
|---|---|---|---|---|---|
| शास्तृ | - ශාස්තෘවරයා | विधातृ | - බ්‍රහ්මයා | सवितृ | - හිරු |
| नप्तृ | - මුණුබුරා | कर्तृ | - කරන්නා | दातृ | - දෙන්නා |
| भर्तृ | - සැමියා | जेतृ | - දිනන්නා | नेतृ | - නායකයා |
| स्थातृ | - සිටින්නා | पातृ | - රකින්නා | छेत्तृ | - කපන්නා |
| पोतृ | - පවිත්‍රකරන්නා | रक्षितृ | - ආරක්ෂකයා | दोग्धृ | - කිරිදොවන්නා |
| वक्तृ | - කියන්නා | श्रोतृ | - අසන්නා | द्रष्टृ | - බලන්නා |

## 11.1 අභ්‍යාසය

පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ कर्षकः खनित्रेण खनति ।

२ शिशवः कन्दुकेन क्रीडन्ति ।

३ अनुजः चषकेन उदकं पिबति ।

४ धनिकाः गगनयानेन देशान्तरं गच्छन्ति ।

५ नाविकाः पोतेन सिन्धुं तरन्ति ।

६ अहं नेत्राभ्यां चित्रं पश्यामि ।

७ उपासकाः पुष्पेभ्यः बुद्धं पूजयन्ति ।

८ पिता पुत्रेण सह देवालयं गच्छति ।

९ हे विनीत, गुरुणा सार्धं विहारं गच्छ ।

१० भ्राता पित्रा सार्धं द्विचक्रेण आपणं गच्छति ।

## 11.2 අභ්‍යාසය

පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

1. උපාසකයා අතින් පහන ගෙන එයි.
2. සැමියා පොරොවෙන් දර පළයි.
3. මම ගුරුවරයා සමග විශ්වවිද්‍යාලයට යමි.
4. පුත්තු දෙදෙන රථ දෙකෙන් ගෙදර එති.
5. මව්වරු කළවලින් ජලය ගෙන එති.
6. අපි මිතුරන් සමග පාසලට යමු.
7. නායකයා අනුශාසකයන් සමග ගුවන්යානයෙන් පිටරට යයි.
8. පින්වත් දරුව, දුර්ජනයන් සමග සෙල්ලම් නොකරන්න.
9. ජනාධිපතිතුමා ඇමතිවරුන් සමග විහාරයට පිවිසෙයි.
10. සීයා මුණුබුරා සමග පාපැදියෙන් නගරයට යයි.

හාවිතයට

**श्रोत्रं श्रुतेनैव न कुण्डलेन ।**
**दानेन पाणिर्न तु कङ्कणेन ॥**
**विभाति कायः खलु सज्जनानां ।**
**परोपकारेण न चन्दनेन ॥**

කන කුණ්ඩලාභරණයෙන් නොව (යහපත් දේ) ඇසීමෙන් ම බබළයි; අත රන් වළල්ලෙන් නොව පරිත්‍යාගයෙන් බබළයි; සත්පුරුෂයන්ගේ ශරීරය සඳුන් ආලේපයෙන් නොව පරෝපකාරයෙන් ම බබළයි.

12
පාඩම
द्वादशः पाठः

# විභක්ති - V
## (චතුර්ථී විභක්තිය)

**චතුර්ථී විභක්තිය**

शिष्य - සිසු        शिष्याय - සිසුවාට

උදා : गुरुः शिष्याय पुस्तकं वितरति ।
ගුරුවරයා ශිෂ්‍යාට පොතක් දෙයි.

उपासकः भिक्षवे चीवरं पूजयति ।
උපාසකයා භික්ෂුවට සිවුරක් පූජාකරයි.

अग्रजः कपये फलं यच्छति ।
අයියා වඳුරාට ගෙඩියක් දෙයි.

उदक    - දිය    उदकाय - දිය පිණිස

උදා : माता उदकाय कूपं गच्छति ।
මව දිය පිණිස ළිඳට යයි.

भिक्षुः पिण्डाय ग्रामं  व्रजति ।
භික්ෂුව පිඬු පිණිස ගමට වඩියි.

सेनापतिः युद्धाय संग्राममभूमिं प्रविशति ।
සෙන්පති යුද පිණිස රණබිමට පිවිසෙයි.

5. **नमः** (නමස්කාර වේවා) **स्वस्ति** (**සෙත් වේවා**) යන නිපාත සමග යෙදෙන නාමයන් ද චතුර්ථී විභක්තියෙන් යෙදේ.

උදා: **नमः** समन्तभद्राय । - බුදුරජාණන්වහන්සේට නමස්කාර වේවා.

**स्वस्ति** गुरवे । - ගුරුවරයාට සෙත් වේවා.

## අවධානයට

ඉහත පාඩම්වල වරනැඟුණු ශබ්ද චතුර්ථී විභක්තියේ වෙනස් ව වරනැඟෙන අයුරු වටහාගන්න.

| शब्द् | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक | बालकाय | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාට | ළමයි දෙදෙනාට | ළමයින්ට |
| कवि | कवये | कविभ्याम् | कविभ्यः |
| | කවියාට | කවියන් දෙදෙනාට | කවියන්ට |
| साधु | साधवे | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාට | සත්පුරුෂයන් දෙදෙනාට | සත්පුරුෂයන්ට |
| पितृ | पित्रे | पितृभ्याम् | पितृभ्यः |
| | පියාට | පියවරුන් දෙදෙනාට | පියවරුන්ට |

## වරනැගීම

### 12.1 ක්‍රියාකාරකම

ආකාරාන්ත ස්ත්‍රීලිංග वनिता ශබ්දය වාචෝද්ගත කරමු.

| विभक्ति | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमा | वनिता | वनिते | वनिताः |
| | ස්ත්‍රිය | ස්ත්‍රීහු දෙදෙන | ස්ත්‍රීහු |
| सम्बोधन | हे वनिते | हे वनिते | हे वनिताः |
| | පින්වත් ස්ත්‍රිය | පින්වත් ස්ත්‍රීහු දෙදෙනනි | පින්වත් ස්ත්‍රියනි |
| द्वितीया | वनिताम् | वनिते | वनिताः |
| | ස්ත්‍රිය | ස්ත්‍රීන් දෙදෙනා | ස්ත්‍රීන් |
| तृतीया | वनितया | वनिताभ्याम् | वनिताभिः |
| | ස්ත්‍රිය විසින් | ස්ත්‍රීන් දෙදෙනා විසින් | ස්ත්‍රීන් විසින් |
| चतुर्थी | वनितायै | वनिताभ्याम् | वनिताभ्यः |
| | ස්ත්‍රියට | ස්ත්‍රීන් දෙදෙනාට | ස්ත්‍රීන්ට |
| पञ्चमी | वनितायाः | वनिताभ्याम् | वनिताभ्यः |
| | ස්ත්‍රියගෙන් | ස්ත්‍රීන් දෙදෙනාගෙන් | ස්ත්‍රීන්ගෙන් |
| षष्ठी | वनितायाः | वनितयोः | वनितानाम् |
| | ස්ත්‍රියගේ | ස්ත්‍රීන් දෙදෙනාගේ | ස්ත්‍රීන්ගේ |
| सप्तमी | वनितायाम् | वनितयोः | वनितासु |
| | ස්ත්‍රිය කෙරෙහි | ස්ත්‍රීන් දෙදෙනා කෙරෙහි | ස්ත්‍රීන් කෙරෙහි |

## වරනැගීම

### 12.2 ක්‍රියාකාරකම

ස්ත්‍රීලිංග वनिता ශබ්දයට සමාන පහත දැක්වෙන ශබ්ද වරනගමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| अम्बा | - මව | बालिका | - බාලිකාව | सुता | - දියණිය |
| कन्या | - කන්‍යාව | ललना | - ස්ත්‍රිය | जाया | - බිරිඳ |

| | | | | | |
|---|---|---|---|---|---|
| कृपा | - කරුණාව | पर्णशाला | - පන්සල | शोभा | - සෝබාව |
| श्रद्धा | - ශ්‍රද්ධාව | प्रज्ञा | - නුවණ | छाया | - සෙවණැල්ල |
| दया | - දයාව | वसुधा | - පොළොව | लङ्का | - ලංකාව |
| दिशा | - දිශාව | प्रतिमा | - පිළිමය | नौका | - නැව |
| शाखा | - අත්ත | शय्या | - ඇඳ | प्रजा | - ප්‍රජාව |
| सभा | - සභාව | कथा | - කතාව | वार्ता | - ප්‍රවෘත්තිය |
| वालुका | - වැල්ල | तारका | - තරුව | वाटिका | - ගෙවත්ත |
| मेधा | - නුවණ | क्षुधा | - බඩගින්න | पिपासा | - පිපාසාව |
| भार्या | - බිරිඳ | प्रमदा | - ගැහැනිය | उपासिका | - උපාසිකාව |
| शिला | - ගල | निशा | - රැය | पाठशाला | - පාසල |

## 12.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල චතුර්ථී විභක්ත්‍යන්ත පද ලියා දක්වන්න.

| शब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| උදා: गज | - | गजाय | गजाभ्याम् | गजेभ्यः |
| १ नृप | - | ........................ | ........................ | ........................ |
| २ मार्जार | - | ........................ | ........................ | ........................ |
| ३ सारथि | - | ........................ | ........................ | ........................ |
| ४ शिशु | - | ........................ | ........................ | ........................ |
| ५ अरि | - | ........................ | ........................ | ........................ |
| ६ सूनु | - | ........................ | ........................ | ........................ |
| ७ गन्तृ | - | ........................ | ........................ | ........................ |
| ८ सुता | - | ........................ | ........................ | ........................ |
| ९ कन्या | - | ........................ | ........................ | ........................ |

2. පහත දැක්වෙන චතුර්ථී විභක්ත්‍යන්ත පදවල වචනය (ඒක/ද්වි/බහුවචන බව) හා තේරුම ලියා දක්වන්න.

| | | වචනය | අර්ථ |
|---|---|---|---|
| १ वाणिजाय | - | .............................. | .............................. |
| २ दरिद्रेभ्यः | - | .............................. | .............................. |
| ३ ऋषये | - | .............................. | .............................. |
| ४ सारथिभ्याम् | - | .............................. | .............................. |

५ बन्धवे - .................................... ....................................

६ विधात्रे - .................................... ....................................

७ सूनुभ्यः - .................................... ....................................

८ भर्तृभ्याम् - .................................... ....................................

९ बालिकायै - .................................... ....................................

१० प्रमदाभ्यः - .................................... ....................................

## 12.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නගන්න.

    १ सुता मार्जाराय अन्नं वितरति ।

    २ भृत्यः वृषभाय जलं ददाति ।

    ३ दायकाः यतिभ्यः दानं वितरन्ति ।

    ४ अमात्यः कृषीवलेभ्यः खनित्राणि प्रयच्छति ।

    ५ जनाधिपः उत्सवाय रथेन व्रजति ।

    ६ नृपतिः वनितायै वस्त्रं प्रयच्छति ।

    ७ बालिका पुष्पाय उद्यानं गच्छति ।

    ८ गुरुः शिष्याय त्यागं वितरति ।

    ९ नमो ऋषये ।

    १० स्वस्ति महाशयाय ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

    1. ගුරුවරයාට නමස්කාර වේවා.
    2. වෙළෙන්දා සේවකයන්ට වැටුප් දෙයි.
    3. මුණුබුරා සැමදා සීයාට කෑම දෙයි.
    4. ප්‍රභුවරයා ආගන්තුකයන්ට ආහාර දෙයි.
    5. මව තරුණිය සමග ජලය පිණිස නදියට යයි.
    6. උපාසිකාව ශ්‍රද්ධාවෙන් බුදුන්ට මල් පුදයි.
    7. පියා පුතුට රසකැවිලි දෙයි.
    8. අයියා මල්ලිට තෑග්ගක් දෙයි.
    9. අනුන්ට පෙළීම පව් පිණිස වේ.
    10. අනුන්ට උපකාර කිරීම පිං පිණිස වේ.

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| तुष्यति | - සතුටුවෙයි | प्रविशति | - පිවිසෙයි | वितरति | - දෙයි |
| ददाति | - දෙයි | प्रयच्छति | - දෙයි | स्पृहयति | - රුචි කරයි |
| पूजयति | - පුදයි | रुष्यति | - කිපෙයි | उपदिशति | - උගන්වයි |

නාමපද

| | | | |
|---|---|---|---|
| अमात्य (පු) | - ඇමති | जनाधिप (පු) | - ජනපති |
| उत्सव (පු) | - උත්සවය | दारक (පු) | - දරුවා |
| भृत्य (පු) | - සේවකයා | पितामह (පු) | - සීයා |
| मार्जार (පු) | - බළලා | महाशय (පු) | - මහාත්මා |
| अन्न (න) | - ආහාර | दान (න) | - දානය |
| काष्ठ (න) | - දර | पुष्प (න) | - මල |
| खनित्र (න) | - උදැල්ල | वेतन (න) | - වැටුප |
| शास्त्र (න) | - ශිල්ප | सर्वदा (නි) | - සදා |

භාවිතයට

परोपकाराय फलन्ति वृक्षाः - परोपकाराय वहन्ति नद्यः ।
परोपकाराय दुहन्ति गावः - परोपकारार्थमिदं शरीरम् ॥

අනුනට වැඩ පිණිස ගස් පලදරයි. අනුනට වැඩ පිණිස ගංගා ගලාබසී. ගවයෝ අනුනට වැඩ පිණිස කිරි දෙත්. මේ ශරීරය ද අනුනට වැඩ පිණිස ම වේ.

13

පාඩම

त्रयोदशः पाठः

# අතීතකාල ආඛ්‍යාත

**අතීත කාලය - අනද්‍යතනාතීත 'ලඞ්'**

| | | | |
|---|---|---|---|
| पचति | - උයයි | अपचत् | - ඉව්වේ ය. |
| गच्छति | - යයි | अगच्छत् | - ගියේ ය. |

අනද්‍යතනාතීත 'ලඞ්' පරස්මෛ පද - ප්‍රත්‍යයමාලාව

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | त् | ताम् | अन् |
| मध्यमपुरुष | स् (:) | तम् | त |
| उत्तमपुरुष | अम् | व | म |

पचति - උයයි (अ) पच (त्) = ඉව්වේ ය.

↑ මුලට අයන්න ↑ අගට අතීත ප්‍රත්‍යය

## 13.1 ක්‍රියාකාරකම

වර්තමාන ක්‍රියාපදවල අතීත ක්‍රියාරූප කිහිපයක් පහත දැක්වේ. ඒවා දෙස හොඳින් අවධානය යොමු කර අතීත 'ලඞ්' ක්‍රියාපද පරස්මෛපදයේ වරනඟා පුහුණු වන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| भवति | - | වෙයි | अभवत् | - | විය |
| पचति | - | උයයි | अपचत् | - | ඉව්වේ ය |
| वन्दति | - | වඳියි | अवन्दत् | - | වැන්දේ ය |
| यच्छति | - | දෙයි | अयच्छत् | - | දුන්නේ ය |
| पिबति | - | බොයි | अपिबत् | - | බිව්වේ ය |
| तिष्ठति | - | සිටියි | अतिष्ठत् | - | සිටියේ ය |
| खादति | - | කයි | अखादत् | - | කෑවේ ය |

## වරනැඟීම

### 13.2 ක්‍රියාකාරකම

✓पच् ධාතු සිද්ධ 'ලඞ්' අනද්‍යතනාතීත පරස්මෛ පද වරනැඟීම

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | अपचत् | अपचताम् | अपचन् |
| | පිසුවේ ය | (දෙදෙනා) පිසුවෝ ය | පිසූහ |
| मध्यमपुरुष | अपचः | अपचतम् | अपचत |
| | පිසුවෙහි | (දෙදෙනා) පිසුවෙහු | පිසුවෙහු |
| उत्तमपुरुष | अपचम् | अपचाव | अपचाम |
| | පිසුවෙමි | (දෙදෙනා) පිසුවෙමු | පිසුවෙමු |

**විශේෂ**

සිංහල භාෂාවේ ස්ත්‍රීලිංග ඒකවචන නාමපදයක් උක්තය වශයෙන් යෙදුණු විට ආඛ්‍යාතය තරමක් වෙනස් ව යෙදේ. සංස්කෘතයේ එසේ නොවේ.

| උදා: පුල්ලිංග | ස්ත්‍රීලිංග |
|---|---|
| पिता गृहम् अगच्छत्। | माता गृहम् अगच्छत्। |
| පියා ගෙදර ගියේ ය. | මව ගෙදර ගියා ය. |
| उपासकः बुद्धम् अवन्दत् | उपासिका बुद्धम् अवन्दत्। |
| උපාසකයා බුදුන් වැන්දේ ය. | උපාසිකාව බුදුන් වැන්දා ය. |

**අතීතකාල ක්‍රියා යොදා සැදුණු සරල වාක්‍යය උගනිමු.**

| | | | | |
|---|---|---|---|---|
| प्र. पु. | अम्बा | ओदनम् | अपचत्। | මව බත් පිසුවාය. |
| | अम्बे | ओदनम् | अपचताम्। | මව්වරු දෙදෙනා බත් පිසුවෝය. |
| | अम्बाः | ओदनम् | अपचन्। | මව්වරු බත් පිසූහ. |
| म. पु. | त्वम् | अक्रीडः। | | නුඹ/තෝ සෙල්ලම් කළෙහි. |
| | युवाम् | अक्रीडतम्। | | නුඹලා/තෙපි දෙදෙනා සෙල්ලම් කළෙහු. |
| | यूयम् | अक्रीडत। | | නුඹලා/තෙපි සෙල්ලම් කළෙහු. |
| उ. पु. | अहम् | अगच्छम्। | | මම ගියෙමි. |
| | आवाम् | अगच्छाव। | | අපි දෙදෙනා ගියෙමු. |
| | वयम् | अगच्छाम। | | අපි ගියෙමු. |

## 13.1 අභ්‍යාසය

1. ඔබ කැමැති ක්‍රියාපද දෙකක් පමණක් 'ලඞ්' පරස්මෛ පදයෙහි වරනගන්න.

2. පහත දැක්වෙන අනද්‍යතනාතීත 'ලඞ්' ක්‍රියාපදවල පුරුෂය, වචනය හා තේරුම දක්වන්න.

| | පුරුෂය | වචනය | තේරුම |
|---|---|---|---|
| १ अगच्छत् - | .............................. | .............................. | .............................. |
| २ अवन्दताम् - | .............................. | .............................. | .............................. |
| ३ अयच्छः - | .............................. | .............................. | .............................. |
| ४ अपठम् - | .............................. | .............................. | .............................. |
| ५ अचोरयन् - | .............................. | .............................. | .............................. |
| ६ अखादत - | .............................. | .............................. | .............................. |
| ७ अतिष्ठाम - | .............................. | .............................. | .............................. |
| ८ अपिबत - | .............................. | .............................. | .............................. |
| ९ अवदाव - | .............................. | .............................. | .............................. |
| १० अपुष्यन् - | .............................. | .............................. | .............................. |

3. පහත දැක්වෙන අතීත ක්‍රියාපද සංස්කෘතයට හරවා දේවනාගරී අකුරින් ලියන්න.

i. දිව්වේ ය .......................................................

ii. පිසුවා ය .......................................................

iii. (දෙදෙන) හමු වූහ .......................................................

iv. ගියෙහි .......................................................

v. සිටියෙමි .......................................................

vi. (දෙදෙන) සෑදෙව්හු .......................................................

vii. බීවෙමු .......................................................

viii. (දෙදෙන) ක්‍රීඩා කළෙහු .......................................................

ix. මිදුහ .......................................................

x. (දෙදෙන) ලිව්වෙමු .......................................................

## 13.2 අභ්‍යාසය

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ बालकः अक्रीडत् ।

२ बालिका अचिन्तयत् ।

३ चोरौ धनं अचोरयताम् ।

४ अहं बुद्धम् अवन्दम् ।

५ लुब्धकाः वनं अगच्छन् ।

६ अम्बा ओदनं अपचत् ।

७ त्वं कथां अकथयः ।

८ वयं मुखानि अक्षालयाम ।

९ उपासिका दारिद्राय आहारम् अयच्छत् ।

१० नृपतिः सेनापतिभिः सार्धं रिपून् अजयत् ।

2. පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරවලින් ලියන්න.

1. මව නිදාගත්තා ය.
2. වඳුරෝ දෙදෙන සෙල්ලම් කළහ.
3. අපි අකුරු ලිව්වෙමු.
4. ළමයි බුදුන් වැන්දහ.
5. නුඹලා චිත්‍රය දුටුවෙහු.
6. බල්ලා සඳට බිරුවේ ය.
7. භික්ෂුව දහම් දෙසීය.
8. අපි දෙදෙන ගී ගැයුවෙමු.
9. බිරිඳ ස්වාමියාට පුවතක් කීවා ය.
10. අම්මා තාත්තා සමඟ පන්සලට ගියා ය.

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| क्रीडति | - | සෙල්ලම් කරයි | अक्रीडत् | - | සෙල්ලම් කළේ ය |
| पठति | - | පාඩම් කරයි | अपठत् | - | පාඩම් කළේ ය |
| लिखति | - | ලියයි | अलिखत् | - | ලියුවේ ය |
| वन्दति | - | වඳියි | अवन्दत् | - | වැන්දේ ය |
| पश्यति | - | බලයි | अपश्यत् | - | බැලුවේ ය |

| | | | | | |
|---|---|---|---|---|---|
| मिलति | - | හමුවෙයි | अमिलत् | - | හමුවූයේ ය |
| जयति | - | දිනයි | अजयत् | - | දිනුවේ ය |
| गायति | - | ගයයි | अगायत् | - | ගැයුවේ ය |
| भषति | - | බුරයි | अभषत् | - | බිරුවේ ය |
| मुञ्चति | - | මුදයි | अमुञ्चत् | - | මිදුවේ ය |
| रचयति | - | රචනා කරයි | अरचयत् | - | රචනා කළේ ය |
| ताडयति | - | තළයි | अताडयत् | - | තැළුවේ ය |
| चोरयति | - | සොරකම් කරයි | अचोरयत् | - | සොරකම් කළේ ය |
| क्षालयति | - | සෝදයි | अक्षालयत् | - | සේදුවේ ය |
| पूजयति | - | පුදයි | अपूजयत् | - | පිදුවේ ය |
| कथयति | - | කියයි | अकथयत् | - | කීවේ ය |

නාමපද

| | | | | | |
|---|---|---|---|---|---|
| लेखक (පු) | - | ලේඛකයා | अम्बा (ස්ත්‍රී) | - | මව |
| लुब्धक (පු) | - | වැද්දා | दारिका (ස්ත්‍රී) | - | ළදැරිය |
| सेवक (පු) | - | සේවකයා | उपासिका (ස්ත්‍රී) | - | උපාසිකාව |
| बलिवर्द (පු) | - | ගොනා | भार्या (ස්ත්‍රී) | - | බිරිඳ |
| उद्यानपालक (පු) | - | උයන්පල්ලා | कथा (ස්ත්‍රී) | - | කතාව |
| सेनापति (පු) | - | සෙන්පතියා | वार्ता (ස්ත්‍රී) | - | පුවත/ප්‍රවෘත්තිය |
| कपि (පු) | - | වඳුරා | गीत (න) | - | ගීතය |
| यति (පු) | - | භික්ෂුව | मुख (න) | - | මුහුණ |
| नृपति (පු) | - | රජු | धन (න) | - | ධනය |
| शिशु (පු) | - | ශිෂ්‍යයා | पुष्प (න) | - | මල |
| रिपु (පු) | - | සතුරා | चित्र (න) | - | චිත්‍රය |
| इन्दु (පු) | - | සඳ | उद्यान (න) | - | උයන |

භාවිතයට

**पुस्तकस्था च या विद्या - परहस्ते च यद्धनम् ।**
**कार्यकाले समायाते - न सा विद्या न तद्धनम् ॥**

පොතෙහි ඇති දැනුම ද අනුන් අත ඇති ධනය ද කටයුතු පැමිණි කල ඒ දැනුම, දැනුමක් ද ඒ ධනය, ධනයක් ද නොවේ.

**14**
**පාඩම**
चतुर्दशः पाठः

# විභක්ති - VI

## (පඤ්චමී විභක්තිය)

### පඤ්චමී විභක්තිය

1. आकाश = අහස  आकाशात् = අහසින් (වෙන්වීම්)

१ आकाशात् जलं पतति । - අහසින් ජලය වැටෙයි.

२ वृक्षात् पत्राणि पतन्ति । - ගසින් කොළ වැටේ.

३ अहं पाठालयात् गृहम् आगच्छामि । - මම පාසලෙන් ගෙදර එමි.

### අවධානයට

ඉහත පාඩම්වල වරනැගුණු ශබ්ද පඤ්චමී විභක්තියේ වෙනස් ව වරනැගෙන අයුරු වටහාගන්න.

| शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक (පු) | बालकात् | बालकाभ्याम् | बालकेभ्यः |
| | ළමයාගෙන් | ළමයින් දෙදෙනාගෙන් | ළමයින්ගෙන් |
| कवि (පු) | कवेः | कविभ्याम् | कविभ्यः |
| | කවියාගෙන් | කවියන් දෙදෙනාගෙන් | කවියන්ගෙන් |
| साधु (පු) | साधोः | साधुभ्याम् | साधुभ्यः |
| | සත්පුරුෂයාගෙන් | සත්පුරුෂයන් දෙදෙනාගෙන් | සත්පුරුෂයන්ගෙන් |
| पितृ (පු) | पितुः | पितृभ्याम् | पितृभ्यः |
| | පියාගෙන් | පියවරුන් දෙදෙනාගෙන් | පියවරුන්ගෙන් |
| वनिता (ස්ත්‍රී) | वनितायाः | वनिताभ्याम् | वनिताभ्यः |
| | වනිතාවගෙන් | වනිතාවන් දෙදෙනාගෙන් | වනිතාවන්ගෙන් |
| पुष्प (න) | पुष्पात् | पुष्पाभ्याम् | पुष्पेभ्यः |
| | මලෙන් | මල් දෙකෙන් | මල්වලින් |

## 14.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල පඤ්චමී විභක්ත්‍යන්ත පද ලියා දක්වන්න.

| | शब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|
| උදා: | गज | - | गजात् | गजाभ्याम् | गजेभ्यः |
| १ | नर | - | .............................. | .............................. | .............................. |
| २ | मुनि | - | .............................. | .............................. | .............................. |
| ३ | सूनु | - | .............................. | .............................. | .............................. |
| ४ | अलि | - | .............................. | .............................. | .............................. |
| ५ | इन्दु | - | .............................. | .............................. | .............................. |
| ६ | जामातृ | - | .............................. | .............................. | .............................. |
| ७ | पीठ | - | .............................. | .............................. | .............................. |
| ८ | बन्धु | - | .............................. | .............................. | .............................. |
| ९ | जेतृ | - | .............................. | .............................. | .............................. |
| १० | वसुधा | - | .............................. | .............................. | .............................. |

2. පහත දැක්වෙන පඤ්චමී විභක්ත්‍යන්ත පදවල ඒකවචන, බහුවචන බව හා තේරුම ලියා දක්වන්න.

| | | | වචනය | අර්ථ |
|---|---|---|---|---|
| १ | शिखरात् | - | .................................... | .................................... |
| २ | पुष्पेभ्यः | - | .................................... | .................................... |
| ३ | इभारेः | - | .................................... | .................................... |
| ४ | भल्लूकाभ्याम् | - | .................................... | .................................... |
| ५ | गिरेः | - | .................................... | .................................... |
| ६ | सेतोः | - | .................................... | .................................... |
| ७ | तरुभ्यः | - | .................................... | .................................... |
| ८ | सवितुः | - | .................................... | .................................... |
| ९ | पातृभ्याम् | - | .................................... | .................................... |
| १० | लतायाः | - | .................................... | .................................... |

## 14.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නඟන්න.

१ अहं गृहात् निर्गच्छामि ।
२ पाणेः चषकः अपतत् ।
३ भिन्नघठात् अम्बु स्रवति ।
४ गिरिशिखरात् उपलानि पतन्ति ।
५ कपयः तरोः अवरोहन्ति ।
६ सज्जनाः अनृतात् विरमन्ति ।
७ मूषिकः बिलात् निष्क्रामति ।
८ शिशवः पाठालयात् गृहम् आगच्छन्ति ।
९ बालिकाः शालायाः निष्क्रामन्ति ।
१० जनाधिपः देशान्तरात् आगच्छति ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න

1. ඇමතිතුමා ප්‍රාසාදයෙන් බසියි.
2. ඇතා කන්දෙන් බසියි.
3. භික්ෂුහු නගරයෙන් කැලයට ගියහ.
4. කුකුළා ගසෙන් බසී.
5. කුරුල්ලෝ කූඩුවලින් නික්මෙති.
6. නැවියෝ නැවෙන් ගොඩබසිති.
7. ගැල්කරුවා ගැලින් ගොනුන් දෙදෙනා මුදයි.
8. වෙළෙන්දෝ ගමින් ගමට සැරිසරති.
9. වනිතාවෝ සභාවෙන් නික්මෙති.
10. පුතණුවනි, කඳු මුදුනින් නොවැටෙන්න.

## අභ්‍යාස සඳහා උපකාරක පද

අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| आगच्छति | - පැමිණෙයි | निष्क्रामति | - නික්මෙයි | मुञ्चति | - මුදයි |
| अवरोहति | - බසියි | सञ्चरति | - සැරිසරයි | रक्षति | - රකියි |
| उत्तरति | - ගොඩබසියි | त्रस्यति | - තැතිගනී | विरमति | - වැළකෙයි |
| निर्गच्छति | - නික්මෙයි | वदति | - කියයි | स्रवति | - වැගිරෙයි |

නාමපද

| | | | |
|---|---|---|---|
| इभ (පු) | - ඇතා | भल्लूक (පු) | - වලසා |
| कुक्कुट (පු) | - කුකුළා | भिक्षु (පු) | - භික්ෂුව |
| गिरिशिखर (පු) | - කඳුමුදුන | भिन्नघट (පු) | - බිඳුණු කළය |
| जानाधिप (පු) | - ජනපති | वाणिज (පු) | - වෙළෙන්දා |
| नाविक (පු) | - නැවියා | शाकटिक (පු) | - ගැල්කරුවා |
| पण्डित (පු) | - පණ්ඩිතයා | शृगाल (පු) | - සිවලා |
| पाठालय (පු) | - පාසැල | सज्जन (පු) | - සත්පුරුෂයා |
| अरि (පු) | - සතුරා | इन्दु (පු) | - සඳ |
| अलि (පු) | - බඹරා | सेतु (පු) | - ඒදණ්ඩ |
| इभारि (පු) | - සිංහයා | सूनु (පු) | - පුතා |
| गिरि (පු) | - කන්ද | जेतृ (පු) | - දිනන්නා |
| मुनि (පු) | - මුනිවරයා | पातृ (පු) | - රකින්නා |
| पाणि (පු) | - අත්ල | सवितृ (පු) | - හිරු |
| अनृत (න) | - බොරුව | राष्ट्र (න) | - රට |
| अम्बु (න) | - ජලය | वल्मीक (න) | - තුඹස |
| उपल (න) | - ගල | शकट (න) | - කරත්තය/ගැල |
| नावा (ස්ත්‍රී) | - නැව | शाला (ස්ත්‍රී) | - ශාලාව |
| वसुधा (ස්ත්‍රී) | - පොළොව | सभा (ස්ත්‍රී) | - සභාව |
| शाखा (ස්ත්‍රී) | - අත්ත | छाया (ස්ත්‍රී) | - සෙවණ/පිළිබිඹුව |

භාවිතයට

**धर्मादर्थः प्रभवति - धर्मात् प्रभवते सुखम् ।**
**धर्मेण लभते सर्वं - धर्मसारमिदं जगत् ॥**

ධර්මයෙන් අර්ථය ලැබේ. ධර්මයෙන් සැපය ද උපදී. ධර්මයෙන් සියල්ල ලබයි. මේ ලොව ම ධර්මයේ හරය වෙයි.

**लोभात् क्रोधः प्रभवति - लोभात् कामः प्रजायते ।**
**लोभात् मोहश्च नाशश्च - लोभः पापस्य कारणम् ॥**

ලෝභයෙන් ක්‍රෝධය හටගනී. ලෝභයෙන් කාමය ඇති වේ. ලෝභයෙන් මුළාව ද විනාශය ද සිදු වේ. ලෝභය පවට හේතුව යි.

15 පාඩම
पञ्चदशः पाठः

# විභක්ති - VII
## (ෂෂ්ඨී විභක්තිය)

**ෂෂ්ඨී විභක්තිය**

1. श्रामणेरः = සාමණේරයන් වහන්ස श्रामणेरस्य = සාමණේරයන් වහන්සේගේ

උදා: 1. श्रामणेरस्य उपाध्यायः पारिवेणं आगच्छति ।

සාමණේරයන්ගේ උපාධ්‍යායන් වහන්සේ පිරිවෙනට පැමිණෙයි.

2. बालिकायाः अक्षराणि सुन्दरानि भवन्ति ।

බාලිකාවගේ අකුරු සුන්දර වේ.

3. पितुः भ्राता गुरुः भवति ।

පියාගේ සොහොයුරා ගුරුවරයෙක් වෙයි.

### අවධානයට

ඉහත පාඩම්වල වරනැඟුණු ශබ්ද ෂෂ්ඨී විභක්තියේ වෙනස් ව වරනැඟෙන අයුරු වටහාගන්න.

| शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक (පු) | बालकस्य | बालकयोः | बालकानाम् |
| | ළමයාගේ | ළමයින් දෙදෙනාගේ | ළමයින්ගේ |
| कवि (පු) | कवेः | कव्योः | कवीनाम् |
| | කවියාගේ | කවියන් දෙදෙනාගේ | කවියන්ගේ |
| साधु (පු) | साधोः | साध्वोः | साधूनाम् |
| | සත්පුරුෂයාගේ | සත්පුරුෂයන් දෙදෙනාගේ | සත්පුරුෂයන්ගේ |
| पितृ (පු) | पितुः | पित्रोः | पितृणाम् |
| | පියාගේ | පියවරුන් දෙදෙනාගේ | පියවරුන්ගේ |
| वनिता (ස්ත්‍රී) | वनितायाः | वनितयोः | वनितानाम् |
| | වනිතාවගේ | වනිතාවන් දෙදෙනාගේ | වනිතාවන්ගේ |
| पुष्प (න) | पुष्पस्य | पुष्पयोः | पुष्पानाम् |
| | මලේ | මල් දෙකේ | මල්වල |

## 15.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල ෂෂ්ඨී විභක්ත්‍යන්ත පද ලියා දක්වන්න.

| | शब्द | | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|---|
| උදා: | गज | - | गजस्य | गजयोः | गजानाम् |
| | १ नायक | - | ........................ | ........................ | ........................ |
| | २ यति | - | ........................ | ........................ | ........................ |
| | ३ पुस्तक | - | ........................ | ........................ | ........................ |
| | ४ रिपु | - | ........................ | ........................ | ........................ |
| | ५ अहि | - | ........................ | ........................ | ........................ |
| | ६ शास्तृ | - | ........................ | ........................ | ........................ |
| | ७ प्रतिमा | - | ........................ | ........................ | ........................ |
| | ८ सवितृ | - | ........................ | ........................ | ........................ |
| | ९ प्रमदा | - | ........................ | ........................ | ........................ |
| | १० रथ | - | ........................ | ........................ | ........................ |

2. පහත දැක්වෙන ෂෂ්ඨී විභක්ත්‍යන්ත පදවල වචනය හා තේරුම ලියා දක්වන්න.

| | | වචනය | අර්ථ |
|---|---|---|---|
| १ शृगालस्य | - | .............................. | .............................. |
| २ कप्योः | - | .............................. | .............................. |
| ३ नप्त्रोः | - | .............................. | .............................. |
| ४ चोराणाम् | - | .............................. | .............................. |
| ५ शत्रुः | - | .............................. | .............................. |
| ६ उटजस्य | - | .............................. | .............................. |
| ७ सुतायाः | - | .............................. | .............................. |
| ८ बालिकानाम् | - | .............................. | .............................. |
| ९ पातृणाम् | - | .............................. | .............................. |
| १० अतिथेः | - | .............................. | .............................. |

## 15.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නඟන්න.

    १ शाकटिकस्य भ्राता शकटात् पतति ।
    २ शिष्याः गुरोः पुस्तकानि पश्यन्ति ।
    ३ कृषीवलानां बलिवर्दाः तृणं खादन्ति ।
    ४ अहं स्नुषायाः गीतं शृणोमि ।
    ५ भ्रातुः पुत्रौ मित्रैः सार्धं क्रीडतः ।
    ६ अहिः दारिकायाः हस्तम् अदशत् ।
    ७ भ्रातुः सुतायाः कण्ठहारः नास्ति ।
    ८ नृपतेः मन्दिरात् सेनापतेः सुते अवरोहतः ।
    ९ नायकस्य भार्या अतिथिभ्यः आहारम् अयच्छत् ।
    १० सेवकयोः नप्तारौ सूदयोः दारकैः सह पाठालयं गच्छतः ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

    1. මිතුරාගේ මල්ලී පන්සලට පැමිණෙයි.
    2. ගොවියාගේ පුතා කුඹුරට ගියේ ය.
    3. ගසේ මුදුනෙන් ගෙඩි වැටෙයි.
    4. අපි පියාගේ දෙපා සැමදා නමදිමු.
    5. ධනවතාගේ බිරිඳ කඩයට ගියා ය.
    6. වෛද්‍යවරයාගේ බෙහෙතින් රෝගය සංසිඳෙයි.
    7. ලංකාවේ ජනයෝ යහපැවැත්මෙන් ජීවත් වෙති.
    8. නායකයාගේ සොහොයුරෝ ගුරුවරයාගේ උපදෙස් පිළිපදිති.
    9. මම සැමද ගුරුවරයාගේ ගුණ වර්ණනා කරමි.
    10. උපාසිකාවගේ දියණිය අයියාගේ දියණියන් දෙදෙනා සමග මල් පිණිස උයනට ගියා ය.

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| अधिगच्छति | - ලබයි | जीवति | - ජීවත්වෙයි | पश्यति | - බලයි/දකියි |
| अवरोहति | - බසියි | दशति | - දෂ්ටකරයි | यच्छति | - දෙයි |
| आगच्छति | - පැමිණෙයි | नमति | - නමදියි | शाम्यति | - සංසිඳෙයි |
| खादति | - කයි | वर्णयति | - වණයි | शृणोति | - අසයි. |

නාමපද

| | | | |
|---|---|---|---|
| अगद (පු) | - බෙහෙත | हस्त (පු) | - අත |
| अग्रज (පු) | - අයියා | सूद (පු) | - කෝකියා/අරක්කැමියා |
| उटज (පු) | - පැල | श्लोक (පු) | - ශ්ලෝකය |
| केदार (පු) | - කුඹුර | यतीन्द्र (පු) | - නාහිමි |
| जन (පු) | - ජනයා | सदाचार (පු) | - යහපැවැත්ම |
| दारक (පු) | - දරුවා | पाद (පු) | - පය |
| बलिवर्द (පු) | - ගොනා | रोग (පු) | - රෝගය |
| शाकटिक (පු) | - ගැල්කරුවා | वैद्य (පු) | - වෛද්‍යවරයා |
| अतिथि (පු) | - ආගන්තුකයා | व्याधि (පු) | - ලෙඩ |
| पाणि (පු) | - අත්ල | नप्तृ (පු) | - මුනුබුරා |
| सेनापति (පු) | - සෙනෙවියා | नेतृ (පු) | - නායකයා |
| भ्रातृ (පු) | - සොහොයුරා | पातृ (පු) | - රකින්නා |
| कण्ठारहा (ස්ත්‍රී) | - මාලය | लङ्का (ස්ත්‍රී) | - ලංකාව |
| दारिका (ස්ත්‍රී) | - ළදැරිය | तनुजा (ස්ත්‍රී) | - දුව |
| वाटिका (ස්ත්‍රී) | - ගෙවත්ත/ගෙවුයන | प्रमदा (ස්ත්‍රී) | - ස්ත්‍රිය/ගැහැණිය |
| आभरण (න) | - අබරණ | भूषण (න) | - අබරණ |
| आहार (න) | - ආහාර | मित्र (න) | - මිතුරා |
| उद्यान (න) | - උයන | तृण (න) | - තණකොළ |
| शिखर (න) | - මුදුන | सर्वदा (නි) | - සැමදා |

### භාවිතයට

**विप्राणां भूषणं विद्या पृथिव्या भूषणं नृपः ।**
**नभसो भूषणं चन्द्रः शीलं सर्वस्य भूषणम् ॥**

බමුණන්ගේ ආභරණය ඉගෙනීමයි. පොළොවෙහි ආභරණය රජ යි. අහසෙහි ආභරණය සඳ යි. සියලු දෙනාගේ ම ආභරණය සීලය යි.

**अलसस्य कुतः शिल्पम् - अशिल्पस्य कुतो धनम् ।**
**अधनस्य कुतो मित्रम् - अमित्रस्य कुतः सुखम् ॥**

අලසයාට ශිල්පයක් (ඉගෙනීමක්) කොයින් ද? ශිල්පයක් නොදත්තා හට ධනයක් කොයින් ද? ධනය නැත්තා හට කවර නම් මිත්‍රයෙක් ද? මිත්‍රයකු නැත්තා හට කවර නම් සැපතක් ද?

16
පාඩම
षोडशः पाठः

# විභක්ති - VIII
## (සප්තමී විභක්තිය)

**සප්තමී විභක්තිය**

1. हस्त = අත                    हस्ते = අතෙහි

१ श्रामणेरः हस्ते प्रदीपं धारयति ।
සාමණේරයන් වහන්සේ අතෙහි පහන දරයි.

२ गुरुः पीठे उपविशति ।
ගුරුවරයා පුටුවෙහි හිඳියි.

३ अहं क्रीडाङ्गणे क्रीडामि ।
මම ක්‍රීඩාපිටියෙහි ක්‍රීඩා කරමි.

### අවධානයට

ඉහත පාඩම්වල වරනැඟුණු ශබ්ද සප්තමී විභක්තියේ වෙනස් වී වරනැඟෙන අයුරු වටහාගන්න.

| शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| बालक (පු) | बालके | बालकयोः | बालकेषु |
| | ළමයා කෙරෙහි | ළමයින් දෙදෙනා කෙරෙහි | ළමයින් කෙරෙහි |
| कवि (පු) | कवौ | कव्योः | कविषु |
| | කවියා කෙරෙහි | කවියන් දෙදෙනා කෙරෙහි | කවියන් කෙරෙහි |
| साधु (පු) | साधौ | साध्वोः | साधुषु |
| | සත්පුරුෂයා කෙරෙහි | සත්පුරුෂයන් දෙදෙනා කෙරෙහි | සත්පුරුෂයන් කෙරෙහි |
| पितृ (පු) | पितरि | पित्रोः | पितृषु |
| | පියා කෙරෙහි | පියවරුන් දෙදෙනා කෙරෙහි | පියවරුන් කෙරෙහි |
| वनिता (ස්ත්‍රී) | वनितायाम् | वनितयोः | वनितासु |
| | වනිතාව කෙරෙහි | වනිතාවන් දෙදෙනා කෙරෙහි | වනිතාවන් කෙරෙහි |
| पुष्प (න) | पुष्पे | पुष्पयोः | पुष्पेषु |
| | මලෙහි | මල් දෙකෙහි | මල්වල |

## 16.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන ශබ්දවල සප්තමී විභක්ත්‍යන්ත පද ලියා දක්වන්න.

| | शब्द | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|---|
| උදා: | गज | - गजे | गजयोः | गजेषु |
| | १ कासार | - .................... | .................... | .................... |
| | २ अन्धु | - .................... | .................... | .................... |
| | ३ उदधि | - .................... | .................... | .................... |
| | ४ नयन | - .................... | .................... | .................... |
| | ५ हरि | - .................... | .................... | .................... |
| | ६ वीणा | - .................... | .................... | .................... |
| | ७ भर्तृ | - .................... | .................... | .................... |
| | ८ शिला | - .................... | .................... | .................... |
| | ९ मृत्यु | - .................... | .................... | .................... |
| | १० छेतृ | - .................... | .................... | .................... |

2. පහත දැක්වෙන සප්තමී විභක්ත්‍යන්ත පදවල වචනය හා තේරුම ලියා දක්වන්න.

| | | වචනය | අර්ථ |
|---|---|---|---|
| १ शीर्षे | - | ............................ | ............................ |
| २ अन्धौ | - | ............................ | ............................ |
| ३ पञ्जरयोः | - | ............................ | ............................ |
| ४ विहगेषु | - | ............................ | ............................ |
| ५ शम्भौ | - | ............................ | ............................ |
| ६ कप्योः | - | ............................ | ............................ |
| ७ दोग्धरि | - | ............................ | ............................ |
| ८ घोटारिषु | - | ............................ | ............................ |
| ९ सन्ध्यायां | - | ............................ | ............................ |
| १० शारिकासु | - | ............................ | ............................ |

## 16.2 අභ්‍යාසය

1. පහත දැක්වෙන වාක්‍ය සිංහලයට නගන්න.

१ ललनायाः हस्ते कुम्भम् अस्ति ।

२ विहगाः तरुषु नीडानि कुर्वन्ति ।

३ बालकस्य हस्तयोः फलानि सन्ति ।

४ कृषीवलस्य घोटारयः गोष्ठे तिष्ठन्ति ।

५ अम्बा महानसे ओदनं पचति ।

६ योषिता सहायिकायाः हस्तयोः पुष्पाणि सन्ति ।

७ वने हरिणकाः अपत्येषु स्निह्यन्ति ।

८ यतयः आरामेषु वसन्ति ।

९ पितामहः गृहस्य द्वारं कुञ्चिकया उद्घाटयति ।

१० अमात्यस्य वाटिकायां लतासु पुष्पाणि विकसन्ति ।

११ कासारे हंसाः च मण्डूकाः च कूर्माः च जीवन्ति ।

१२ कुञ्चिका पेटिकायां अस्ति इति स्नुषा जामात्रम् अवदत् ।

2. පහත දැක්වෙන වාක්‍ය සංස්කෘතයට නගා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

1. මිතුරාගේ අතේ මල් ඇත.
2. පින් කරන්නෝ දෙව්ලොව වෙසෙති.
3. දැරියගේ ඇකිරිල්ල මත බළලා නිදයි.
4. දියණිය පියාට සෙනෙහෙ කරයි.
5. මුවෝ විල්තෙරෙහි තණකොළ කති.
6. ඇත්තු වනයෙහි සැරිසරත්.
7. මම පාසැලෙහි සිසුන් සමග උගනිමු.
8. ධනවත්තු නගරවල වාසය කරති.
9. නෑයෝ කොළඹ නගරයෙහි සැපසේ ජීවත් වෙති.
10. ගොවියෝ කුඹුරුවල දෑකැත්තෙන් ගොයම් කපති.
11. නගරයේ වීථිවල විදේශිකයෝ සැරිසරති.
12. දියෙහි කරත්තය නො යයි. නැව ගොඩබිම නො යයි.

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| अस्ति | - ඇත | पचति | - පිසයි | उद्घाटयति | - විවර කරයි/අරියි |
| विकसति | - පිපෙයි | याति | - යයි | शुष्यति | - වියැළෙයි |
| करोति | - කරයි | लुनाति | - කපයි | नृत्यति | - නටයි |
| खादति | - කයි | लुम्पति | - කපයි | स्निह्यति | - සෙනෙහෙ කරයි |
| जीवति | - ජීවත් වෙයි | वदति | - කියයි | सञ्चारयति | - සංචාරය කරයි |
| तिष्ठति | - සිටියි | वसति | - වසයි | वादयति | - වාදනය කරයි |

නාමපද

| | | | |
|---|---|---|---|
| अमात्य (පු) | - ඇමති | पापकारक (පු) | - පව්කරන්නා |
| गोष्ठ (පු) | - ගාල/ගවහල | दायक (පු) | - දායකයා |
| कासार (පු) | - විල | पितामह (පු) | - සීයා |
| कुम्भ (පු) | - කළය | मण्डूक (පු) | - මැඩියා |
| कूर्म (පු) | - ඉදිබුවා/ඉබ්බා | महानस (පු) | - කුස්සිය/මුළුතැන් ගෙය |
| केदार (පු) | - කුඹුර | विहग (පු) | - කුරුල්ලා |
| दरिद्र (පු) | - දිළින්දා | विष्टर (පු) | - ඇතිරිල්ල |
| निषाद (පු) | - නියංසමය | विदेशिक (පු) | - විදේශිකයා/පිටරැටියා |
| शकट (පු) | - කරත්තය | हस्त (පු) | - අත |
| उदधि (පු) | - සාගරය | यति (පු) | - භික්ෂුව |
| कपि (පු) | - වඳුරා | हरि (පු) | - විෂ්ණු |
| घोटारि (පු) | - මීමා | ज्ञाति (පු) | - නෑයා |
| अन्धु (පු) | - ළිඳ | मृत्यु (පු) | - මාරයා |
| तरु (පු) | - ගස | रिपु (පු) | - සතුරා |
| बन्धु (පු) | - නෑයා | शम्भु (පු) | - ඊශ්වර |
| दोग्धृ (පු) | - කිරිදොවින්නා | छेतृ (පු) | - කපන්නා |
| भर्तृ (පු) | - ස්වාමියා | नावा (ස්ත්‍රී) | - නැව |
| कुञ्चिका (ස්ත්‍රී) | - යතුර | ललना (ස්ත්‍රී) | - ලලනාව |
| दया (ස්ත්‍රී) | - දයාව | वीणा (ස්ත්‍රී) | - වීණාව |
| दारिका (ස්ත්‍රී) | - දැරිය | शय्या (ස්ත්‍රී) | - සයනය/ඇඳ |
| पेटिका (ස්ත්‍රී) | - පෙට්ටිය | शारिका (ස්ත්‍රී) | - සැළලිහිණියා |
| योषिता (ස්ත්‍රී) | - තරුණිය | शिला (ස්ත්‍රී) | - ගල |

रथ्या (ස්ත්‍රී) - වීදිය
वाटिका (ස්ත්‍රී) - උයන
अपत्य (න) - පැටියා
उदक (න) - දිය
कारागार (න) - සිරගෙය
तृण (න) - තණ ( කොළ )
नयन (න) - ඇස
नीड (න) - කැදැල්ල
पञ्जर (න) - කූඩුව
पर्ण (න) - කොළය
स्थल (න) - ගොඩ
सन्ध्या (ස්ත්‍රී) - සැඳෑව
सहायिका (ස්ත්‍රී) - යෙහෙළිය
फल (න) - ගෙඩිය
दात्र (න) - දෑකැත්ත
द्वेष (න) - තරහ
वन (න) - කැලය
सस्य (න) - ගොයම්
शीर्ष (න) - හිස/සිරස
सरस्तीर (න) - විල්තෙර
सुख (න) - සැප

හාවිතයට

उदये सविता रक्तो रक्तश्चास्तमये तथा ।
सम्पत्तौ च विपत्तौ च महतामेकरूपता ॥

උදෑසන හිරු රතු පැහැති ය. හිරු බැස යාමේ දී ද එසේ රතු පැහැති ය. එලෙසින් සැපතේ දී ද විපතේ දී ද උතුමන්ගේ ස්වභාවය එක ම ය.

उत्सवे व्यसने चैव दुर्भिक्षे राष्ट्रविप्लवे ।
राजद्वारे श्मशाने च यस्तिष्ठति स बान्धवः ॥

උත්සවයක දී මෙන් ම විපතක දී ද කෑම හිඟයක දී මෙන් ම රටේ විපතක දී ද රජ ගෙදොර දී මෙන් ම සොහොන්පළේ ද යමෙක් ළඟ සිටී නම් ඔහු නෑයෙකි.

# 17 පාඩම
සප්තදශඃ පාඨඃ

# අව්‍යය පද

ව්‍යය නොවන හෙවත් වෙනස් නොවන ශබ්ද අව්‍යය නම් වේ. ලේඛනයේ දී මෙන් ම භාෂණයේ දී භාෂාවට විශාල මෙහෙයක් කරන පද විශේෂයක් ලෙස අව්‍යය පද හැඳින්විය හැකි ය.

ස්ත්‍රී, පුරුෂ, නපුංසක යන ලිංගත්‍රයට අයත් නැති, ප්‍රථමා ආදි සියලු විභක්තිවල නොවරනැඟෙන, වෙනසක් නොමැති ව භාවිත වන පද මාලාව අව්‍යය නම් වේ. මේ අනුව සෙසු නාමපද, ක්‍රියාපදවල මෙන් අව්‍යය පදවල වරනැඟීමක්, වචන භේදයක් නොමැති බව ප්‍රකට ය. අව්‍යය ගණයට අයත් වන්නේ

1 නිපාත
2 උපසර්ග යන දෙවර්ගය යි.

## 1. නිපාත

'ච' යනාදි පද සමූහය නිපාත නම් වේ. නිපාත පද සීමා රහිත ය. වචනයක හෝ වාක්‍යයක මුල, මැද, අග යන කවර තැනක හෝ පද පූරණ වශයෙන් ද, වාක්‍ය පූරණය සඳහා ද නිපාත පද භාෂාවේ භාවිත වෙයි. සංස්කෘත භාෂාවේ නාමපද හා ක්‍රියාපද මෙන් නිතර භාවිත වන නිපාත පද වර්ග හයක් (6) පමණ දක්වා ඇත. ඉදිරි ශ්‍රේණිවල දී ඒවා පිළිබඳව විස්තරාත්මක ව උගත හැකි ය.

### 17.1 ක්‍රියාකාරකම

නිතර යෙදෙන නිපාත කිහිපයක් පහත දැක්වේ. ඒවා මතකයෙහි තබාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| हे | - එම්බා | भो | - එම්බා | स्वयम् | - තොමේ |
| अत्र | - මෙහි | तत्र | - එහි | यत्र | - යම්තැනක |
| सर्वत्र | - හැමතැන | एकत्र | - එක්තැනක | कुत्र | - කොහි |
| दूरात् | - දුරින් | सततम् | - නිතර | अनन्तरम् | - අනතුරුව |
| कथम् | - කෙසේ | तथा | - එසේ | यथा | - යම්සේ |
| अथ | - ඉක්බිති | पुनर् | - නැවත | मा | - එපා |
| भृशम् | - දැඩි සේ | बहिस् | - පිටත | एवम् | - මෙසේ |
| वत् | - මෙන් | च | - ද | आशु | - වහා |

| | | | |
|---|---|---|---|
| खलु / किल | - වනාහි | नूनम् / वै | - ඒකාන්තයෙන් |
| अथवा / किंतु | - නමුත් | यदि / चेत् / सचेत् | - ඉදින් |
| यथारूपम् | - සුදුසු පරිදි | | |

කාලය හඟවන කාලාර්ථ නිපාත

| | | | | | |
|---|---|---|---|---|---|
| तदा | - එකල | यदा | - යම්දිනක | कदा | - කෙදින |
| सर्वदा | - සැමද | पुरा | - පෙර | प्रातर् | - උදෑසන |
| दिवा | - දහවල් | सायम् | - සවස | नक्तं | - රාත්‍රි |
| ह्यः | - ඊයේ | अद्य | - අද | श्वः | - හෙට |
| परश्वः | - අනිද්දා | परेद्युः | - පෙරදා | पूर्वेद्युः | - පෙරදිනක |
| सद्यः | - එකෙණෙහි | चिरम् | - බොහෝ කලක් | | |
| अधुना / साम्प्रतम् / इदानीम् | | - දැන් | | तदानीम् | - එකල්හි |

## අවධානයට

නිපාත වාක්‍යවල යෙදෙන අයුරු වටහා ගන්න.

උදා: १ हे बालक, त्वं नित्यं पठ।
පින්වත් ළමය, නුඹ නිතර පාඩම් කරව.

२ श्रामणेरः सर्वदा बुद्धं नमति।
ශ්‍රාමණේරයන් වහන්සේ සැමදා බුදුන් නමදියි.

යුගල වශයෙන් වාක්‍යවල යෙදී නිතර භාවිත වන නිපාත

यत्र - तत्र

උදා: यत्र त्वं पठसि, अहं तत्र आगच्छामि।
යම්තැනක නුඹ පාඩම් කරහි ද මම එතැනට එමි.

यथा - तथा

උදා: यथा गुरुः कथयति, तथा छात्रः करोति।
යම්සේ ගුරුවරයා කියයි ද එසේ ශිෂ්‍යයා කරයි.

यदा - तदा

උදා: यदा अहं ग्रामं गच्छामि, तदा त्वं तत्र आगच्छ।
යම් දිනෙක මම ගමට යම් ද එදින නුඹ එහි එව.

यदि - तर्हि

උදා: यदि त्वं यत्नेन पठसि, तर्हि परीक्षणात् समर्थः भवसि।
ඉදින් නුඹ උත්සාහයෙන් පාඩම් කරහි ද එවිට විභාගයෙන් සමත් වෙහි.

यावत् - तावत्

උදා: याचकः यावत् इच्छति, हे दारक, तावत् वितर।
සිඟන්නා යම්තාක් කැමති ද දරුව, ඒතාක් දෙව.

## 2. උපසර්ග

අව්‍යය පදවල දෙවැනි වර්ගය උපසර්ග නම් වේ. නිපාත බහුල වුවත් උපසර්ග පද විස්සක් පමණක් සංස්කෘත භාෂාවේ භාවිත වේ. ක්‍රියාමූලයක හෝ නාමමූලයක මුලින් පමණක් උපසර්ග පද යොදනු ලැබේ. එවිට අර්ථය වෙනස් වීමක්, සමාන වීමක් හෝ අලංකාර වීමක් සිදු වේ. 'ප්‍ර' ආදි පද/අකුරු උපසර්ග නම් වේ. උපසර්ග පද විස්ස සහ ඒවා භාෂාවේ යෙදෙන අයුරු පහතින් දැක්වේ.

अति,अधि, अनु, अप, अपि, अभि, अव, आ, उत्,
उप, दुर्, नि, निर्, प्र, प्रति, परा, परि, वि, सम्, सु

| | | | | |
|---|---|---|---|---|
| अति | - | अतिक्रामति | - | ඉක්මවායයි |
| अधि | - | अधिगच्छति | - | අත්පත්කර ගනී /ලබයි |
| अनु | - | अनुसरति | - | පසුපස යයි |
| अप | - | अपनयति | - | බැහැර ගෙනයයි |
| अपि | - | अपिधान | - | වැස්ම/පියන |
| अभि | - | अभिधर्म | - | ගැඹුරු ධර්මය |
| अव | - | अवतरति | - | බසියි |
| आ | - | आनयति | - | ගෙන එයි |
| उत् | - | उद्गच्छति | - | පැන නඟියි |
| उप | - | उपगच्छति | - | ළංවෙයි |
| दुर् | - | दुर्गन्ध | - | දුගඳ |
| नि | - | निषीदति | - | හිඳියි |
| निर् | - | निर्गच्छति | - | නික්මෙයි |
| प्र | - | प्रणमति | - | වඳියි |
| प्रति | - | प्रतिभाषते | - | පිළිතුරු දෙයි |
| परा | - | पराजयति | - | පරදියි |
| परि | - | परिणयति | - | පාවා දෙයි |
| वि | - | विश्लिष्यति | - | වෙන් වෙයි |
| सम् | - | संगच्छति | - | එකතු වෙයි |
| सु | - | सुदर्शन | - | මනා දක්ම |

## 17.1 අභ්‍යාසය

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

१ हे बालक सततं सत्यं वद ।
२ उपासिका सर्वदा एव बुद्धं प्रणमति ।
३ उपासकः पुण्येण देवलोकं अधिगच्छति ।
४ प्राक् पर्वतात् सूर्यः उद्गच्छति ।
५ गुरुः शिष्येभ्यः पुस्तकानि प्रयच्छति ।
६ जनकः दिवा भोजनाय गृहं आगच्छति ।
७ मार्जारः आशु वृक्षात् अवरोहति ।
८ गोपालः सायं वृषभम् आनयति ।
९ शिष्याः सततं गुरून् अनुसरन्ति ।
१० यतिः ग्रामे पिण्डाय विचरति ।
११ याचकः दण्डेण भृशं शुनकं प्रहरति ।
१२ छात्रः सर्वदा प्रातः मुखं प्रक्षालयन्ति ।
१३ पिता च सुता च प्रातः विपणिं प्रति अगच्छताम् ।
१४ हे बालक, व्याघ्रस्य समीपं कदा अपि मा गच्छ ।
१५ शिशवः गुरुभिः सार्धम् अध्ययनाय विद्यालयं प्रति गच्छन्ति ।

2. පහත සඳහන් ශ්ලෝකවල ඇති අව්‍යය පද උපුටා දක්වන්න.

शैले शैले न माणिक्यं मौक्तिकं न गजे गजे ।
साधवो न हि सर्वत्र चन्दनं न वने वने ॥

यथा धेनुसहस्रेषु वत्सो विन्दति मातरम् ।
एवं पूर्वकृतं कर्म कर्तारम् अनुगच्छति ॥

## අභ්‍යාස සඳහා උපකාරක පද

ක්‍රියාපද

| | | | | | |
|---|---|---|---|---|---|
| अधिगच्छति | - | අත්පත්කර ගනියි | पृच्छति | - | විචාරයි |
| अनुभवति | - | විඳියි | प्रक्षालयति | - | සෝදයි |
| अनुसरति | - | අනුගමනය කරයි | प्रतिगच्छति | - | වෙතට යයි |
| अवरोहति | - | බසියි | प्रणमति | - | වඳියි |
| आगच्छति | - | පැමිණෙයි | प्रयच्छति | - | දෙයි |
| आनयति | - | ගෙනඑයි | प्रहरति | - | පහරදෙයි |
| उद्गच्छति | - | නගියි/උඩට මතුවෙයි | व्रजति | - | යයි |
| उत्तिष्ठति | - | නැගී සිටියි | विचरति | - | සැරිසරයි |

නාමපද

| | | |
|---|---|---|
| गोपाल (පු) | - | ගොපල්ලා |
| चित्रक (පු) | - | කොටියා |
| जन (පු) | - | ජනයා |
| देवलोक (පු) | - | දෙව්ලොව |
| पर्वत (පු) | - | පර්වතය |
| विद्यालय (පු) | - | විදුහල |
| अध्ययनम् (න) | - | ඉගැනීම |
| चक्र (න) | - | රෝදය |
| काष्ठ (න) | - | දර |
| कष्ट (න) | - | දුක් |
| पुण्य (පු) | - | පින |
| पिण्ड (පු) | - | පිඬු |
| विपणि(පු) | - | කඩය |
| विदेश (පු) | - | පිටරට |
| व्याघ्र (පු) | - | ව්‍යාඝ්‍රයා |
| सत्य (පු) | - | සත්‍ය |
| वाहन (න) | - | වාහනය |
| मुख (න) | - | මුහුණ |
| मूल्य (න) | - | මුදල් |

භාවිතයට

मातेव रक्षति पितेव हिते नियुङ्क्ते
कान्तेव चाभिरमयत्यपनीय खेदम् ।
कीर्तिं च दिक्षु विमलां वितनोति लक्ष्मीं
किं किं न साधयति कल्पलतेव विद्या ॥

මවක මෙන් රකී. පියා මෙන් යහපතෙහි යොදවයි. කාන්තාවක මෙන් දුක දුරලා සිත් අලවයි. දිසාවන්හි යහපත් කීර්තිය ද ඉසුරුමත් බව ද පතුරයි. ඉගෙනීම කල්පලතාව මෙන් කුමක් නම් ඉටු නොකරයි ද?

18
පාඩම
अष्टादशः पाठः

# අනාගතකාල ක්‍රියාපද

## අනාගතකාලය - භවිෂ්‍යත් 'ලෘට්'

नमति = වඳියි    नमिष्यति = වඳින්නේ ය.
पतति = වැටෙයි    पतिष्यति = වැටෙන්නේ ය.

භවිෂ්‍යත් 'ලෘට්' පරස්මෛ පද - ප්‍රත්‍යය මාලාව

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | स्यति | स्यतः | स्यन्ति |
| मध्यमपुरुष | स्यसि | स्यथः | स्यथ |
| उत्तमपुरुष | स्यामि | स्यावः | स्यामः |

√ नम् ධාතු සිද්ධ 'ලෘට්' භවිෂ්‍යත් පරස්මෛපදයෙහි වරනැඟීම

| पुरुष | एकवचन | द्विवचन | बहुवचन |
|---|---|---|---|
| प्रथमपुरुष | नमिष्यति | नमिष्यतः | नमिष्यन्ति |
| | වඳින්නේ ය | (දෙදෙන) වඳින්නාහ | වඳින්නාහ |
| मध्यमपुरुष | नमिष्यसि | नमिष्यथः | नमिष्यथ |
| | වඳින්නෙහි | (දෙදෙන) වඳින්නෙහු | වඳින්නෙහු |
| उत्तमपुरुष | नमिष्यामि | नमिष्यावः | नमिष्यामः |
| | වඳින්නෙමි | (දෙදෙන) වඳින්නෙමු | වඳින්නෙමු |

## 18.1 ක්‍රියාකාරකම

පහත සඳහන් 'ලට්' ලකාර ක්‍රියාපදවලින් (වර්තමානකාල ක්‍රියාපදවලින්) 'ලෘට්' ලකාර ක්‍රියාපද (අනාගතකාල ක්‍රියාපද) වෙනස්වන ආකාරය හඳුනා ගනිමු.

| 'ලට්' (වර්තමානකාල) ක්‍රියාපද | | | 'ලෘට්' (අනාගතකාල) ක්‍රියාපද | | |
|---|---|---|---|---|---|
| गच्छति | - | යයි | गमिष्यति | - | යන්නේ ය |
| धावति | - | දුවයි | धाविष्यति | - | දුවන්නේ ය |
| पतति | - | වැටෙයි | पतिष्यति | - | වැටෙන්නේ ය |
| पूजयति | - | පුදයි | पूजयिष्यति | - | පුදන්නේ ය |
| नमति | - | නමදියි | नमिष्यति | - | නමදින්නේ ය |
| खादति | - | කයි | खादिष्यति | - | කන්නේ ය |
| पठति | - | පාඩම් කරයි | पठिष्यति | - | පාඩම්කරන්නේ ය |
| वसति | - | වසයි | वसिष्यति | - | වසන්නේ ය |
| आरोहति | - | නගියි | आरुहिष्यति | - | නගින්නේ ය |
| वदति | - | කියයි | वदिष्यति | - | කියන්නේ ය |
| भुङ्क्ते | - | අනුභව කරයි | भुङ्क्ष्यति | - | අනුභව කරන්නේ ය |
| क्रीडति | - | ක්‍රීඩා කරයි | क्रीडयिष्यति | - | ක්‍රීඩා කරන්නේ ය |
| खनति | - | සාරයි | खनिष्यति | - | සාරන්නේ ය |

## 18.1 අභ්‍යාසය

1. පහත සඳහන් සංස්කෘත වාක්‍ය සිංහලයට නඟන්න.

    १ वानरः वृक्षम् आरुहिष्यति ।

    २ त्वं ग्रामं गमिष्यसि ।

    ३ आवां बुद्धं वन्दिष्यावः ।

    ४ उपासकाः पुष्पाणि पूजयिष्यन्ति ।

५ अहं फलं खादिष्यामि ।

६ वयम् मोदकान् खादिष्यामः ।

७ मुनिः सुभाषितं वदिष्यति ।

८ कर्षकाः क्षेत्रं गमिष्यन्ति ।

2. පහත සඳහන් සිංහල වාක්‍ය සංස්කෘතයට නඟා දේවනාගරී අක්ෂරයෙන් ලියන්න.

1. මම ගමට යන්නෙමි.
2. ළමයි සෙල්ලම් කරන්නාහ.
3. තුඹ බත් පිසන්නෙහි.
4. පියා බුදුන් වඳින්නේ ය.
5. නුඹලා දෙදෙන යන්නෙහු.
6. රජකුමා රට පාලනය කරන්නේ ය.
7. අපි නෙලුම්මල් පුදන්නෙමු.
8. කුරුල්ලෝ පියාඹන්නාහ.
9. මම සෙල්ලම් කරන්නෙමි.
10. කුමාරයෝ දෙදෙන පාඩම් කරන්නාහ.

භාවිතයට

**नन्दन्ति उदितेऽदित्ये नन्दन्ति अस्तमितेऽहनि ।**
**आत्मनो नावबुध्यन्ते मनुषा जीवितक्षयम् ॥**

හිරු උදා වූ කල්හි සතුටු වෙති. දවස ගෙවීගිය කල්හි ද සතුටු වෙති. මිනිස්සු තමන්ගේ ජීවිතය ගෙවීයන බව අවබෝධ නො කරගනිති.

19
පාඩම
एकोनविंशः पाठः

# සන්ධි

## සන්ධි

සන්ධි, සංස්කෘත භාෂාවේ ප්‍රධාන ව්‍යාකරණ සිද්ධාන්තයකි. සන්ධිවල දී මූලික වන්නේ ස්වර ව්‍යඤ්ජන ආදි අක්ෂරයෝ ය. ළං ව තිබෙන අකුරු දෙකක් එකතු කොට ගැළපීම සන්ධි නම් වේ. ගැමි ව්‍යවහාරයේ දී පොල් + අත්ත = පොල්ලත්ත ලෙස සන්ධි පදයක් වශයෙන් භාවිත වේ. අකුරු, වචන වෙන් කිරීම විසන්ධි ලෙස ද එකට එකතු වූ පසු සන්ධි ලෙස ද භාවිත කරනු ලැබේ. ලෝප, ආදේශ, ආගම, ද්විත්ව, ප්ලුත, හ්‍රස්ව, දීර්ඝ ආදි උපරීති රැසක් ද සන්ධිවලට දායක වේ. මුල් පදයේ අග අකුරත් අග පදයේ මුල් අකුරත් සන්ධි රීතියට යොමු වේ.

සංස්කෘත සන්ධිවල දී අභ්‍යන්තර සන්ධි හා බාහිර සන්ධි වශයෙන් දෙකොටසක් දැකිය හැකි ය.

1. එක ම පදයක සිදු වන එක් වීම අභ්‍යන්තර සන්ධි නම් වේ.

   උදා:- भर्तृ + आ = भर्ता

   භර්තෘ + ආ = භර්තා = සැමියා

2. පද දෙකක් අතර සිදු වන එක් වීම බාහිර සන්ධි නම් වේ.

   උදා:- मुनि + इन्द्र = मुनीन्द्र

   මුනි + ඉන්ද්‍ර = මුනීන්ද්‍ර - බුදුරජාණන් වහන්සේ

සංස්කෘත සාරස්වත ව්‍යාකරණ ග්‍රන්ථයට අනුව සන්ධි වර්ග පහකි. ඒවා නම්

1. ස්වර සන්ධි
2. ව්‍යඤ්ජන සන්ධි
3. අනුස්වාර සන්ධි
4. විසර්ග සන්ධි
5. ප්‍රකෘති සන්ධි

ඉහත සන්ධි වර්ගවලට අයත් සන්ධි රීති බොහෝමයක් ඇත. ඒවා විස්තරාත්මක ව ඉහළ පන්තිවල දී උගත හැකි ය. මෙම ශ්‍රේණියේ දී ඒ ඒ සන්ධි වර්ග පිළිබඳ ව සාමාන්‍ය අවබෝධයක් සහ ඒ ඒ සන්ධි වර්ගයන්ට අයත් එක් සන්ධි රීතියක් පමණක් උගත හැකි ය.

## 1. ස්වර සන්ධිය

සන්ධි වන පදවල දී මුල් පදයේ අගත්, අග පදයේ මුලත් ස්වර අක්ෂර පැවතීම ස්වර සන්ධියේ ලක්ෂණය යි. ස්වරයන් මුල් වී ලෝප, ආදේශ, ආදී රීතිවලට යටත් ව සිදුවන සන්ධිය ස්වර සන්ධි නම් වේ.

උදා:- सुर + असुर = सुरासुर

සන්ධි රීතිය

මුල පදයේ අග සහ අග පදයේ මුල සමාන ස්වර ඇති විට ඒ දෙක ම එකතු ව එම වර්ගයේ ම එක් දීර්ඝයක් වේ.

ස්වර පිහිටීම හා සන්ධිපද

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා:- | अ | + | अ | = | आ |
| | अ | + | आ | = | आ |
| | आ | + | अ | = | आ |
| | आ | + | आ | = | आ |

අනෙකුත් इ उ ऋ ऌ ස්වර ද මේ ක්‍රමයෙන් පැවති විට ඒවායේ දීර්ඝය වේ.

परम + आनन्द > परम् + अ + आ + नन्द > परम् + आ + नन्द = परमानन्द

विद्या + अलङ्कार = विद्यालङ्कार

शाला + अधिपति = शालाधिपति

## 2. ව්‍යඤ්ජන සන්ධිය

සන්ධි වන පද දෙකෙහි ව්‍යඤ්ජන අක්ෂර මුල් වී සෑදෙන සන්ධිය ව්‍යඤ්ජන සන්ධි නම් වේ. ලෝප, ආදේශ, ද්විත්ව ආදී රීති එම සන්ධියට ද එලෙස ම බලපානු ඇත.

උදා:- वाक् + ईशः = वागीशः

සන්ධි රීතිය

ස්වරයක් පරකල්හි මුලින් යෙදී ඇති අඝෝෂයට එම වර්ගයේ ම ඝෝෂය ආදේශ වේ.

උදා:- अघोष + स्वर (अ, आ, इ, ई ආදී)
↓
घोष

එනම් क च ट त प යන අඝෝෂයන්ට පිළිවෙළින්
ग ज ड द ब ඝෝෂයෝ වෙති.

वाक् + अर्थः > वाग् + अर्थः = वागर्थः
अच् + अन्तः > अज् + अन्तः = अजन्तः
षट् + अङ्गः > षड् + अङ्गः = षडङ्गः
महत् + इदम् > महद् + इदम् = महदिदम्
ककुप् + अत्र > ककुब् + अत्र = ककुबत्र

## 3. අනුස්වාර සන්ධිය

අනුස්වාරය හෙවත් 'ं' (බින්දුව) මුල් වී සෑදෙන සන්ධිය අනුස්වාර සන්ධි නම් වේ. ව්‍යඤ්ජන සන්ධියේ ම කොටසක් වන මෙය ද, ලෝප - ආදේශ ආදී රීතිවලට අනුගත වේ.

උදා:- किं + अस्ति = किमस्ति

සන්ධි රීතිය

ස්වරයක් පරකල්හි මුලින් යෙදී ඇති අනුස්වාරයට (බින්දුවට) 'ම්' ආදේශ වේ.

උදා:- ं + स्वर
↓
म्

इदं + आसनम् > इदम् + आसनम् = इदमासनम्
गृहं + आगच्छति > गृहम् + आगच्छति = गृहमागच्छति
जलं + आदाय > जलम् + आदाय = जलमादाय

## 4. විසර්ග සන්ධිය

විසර්ගය (ः) සංස්කෘත නාමපදවලට විශේෂ වූවකි. එම විසර්ගය මූලික වී ලෝප, ආදේශාදි ක්‍රමවලින් සෑදෙන සන්ධිය විසර්ග සන්ධි නම් වේ. මුල් පදයේ විසර්ගය යෙදී තිබීම මෙහි මූලික ලක්ෂණයකි.

උදා:- कविः + एति = कविरेति

සන්ධි රීතිය

ස්වරයක් හෝ ඝෝෂාක්ෂරයක් පර ව සිටි කල්හි නාමින් ස්වර කෙරෙන් පර විසර්ගයට (ඃ) 'ර්' යන්නක් ආදේශ වේ.

උදා:- नामिन् + ः + स्वर / घोष
↓
र्

मुनिः + आगच्छति > मुनिर् + आगच्छति = मुनिरागच्छति

भानुः + उदेति > भानुर् + उदेति = भानुरुदेति

कविः + गच्छति > कविर् + गच्छति = कविर्गच्छति

वायुः + वाति > वायुर् + वाति = वायुर्वाति

## 5. ප්‍රකෘති සන්ධිය

ස්වර, ව්‍යඤ්ජන ආදි ඉහත කී සන්ධිවල දී මෙන් ලෝප - ආදේශ ආදි ක්‍රමවලින් සන්ධි නොවන සන්ධි විශේෂ ප්‍රකෘති සන්ධි නම් වේ. සන්ධි, විසන්ධි පද දෙකේ දී ම එක ම අයුරින් වචනය පිහිටීම හෙවත් ස්වභාවයෙන් ම සන්ධි වී පැවතීම ප්‍රකෘති සන්ධියේ විශේෂ ලක්ෂණය වේ.

උදා:- अग्नि + अत्र = अग्नि अत्र

हे + बुद्ध = हे बुद्ध

अहो + ईश्वर = अहो ईश्वर

### 19.1 අභ්‍යාසය

01. පහත සඳහන් පද සන්ධි කරන්න.

| | | |
|---|---|---|
| १ कवि + ईश्वर | २ धनुः + आनयति | ३ गज + आननः |
| ४ बुद्धं + अवन्दत् | ५ पाठालयात् + आगच्छति | ६ अहो + देव |
| ७ अयं + एव | ८ हे + छात्र | ९ गौ + धावति |
| १० उत् + गच्छति | | |

02. පහත සඳහන් වාක්‍ය සිංහලයට නඟන්න. ඉරි ඇඳි පද විසන්ධි කොට දක්වන්න.

१ जनाः दानेन परमानन्दं लभन्ति ।

२ जनाधिपः परेद्युः विदेशमगच्छत् ।

३ प्रभाते एव मुनिरागच्छति आश्रमम् ।

४ वर्षाकाले सर्वत्र वायुर्वाति ।

५ हे छात्र त्वं नित्यं सत्यं वद ।

६ गुरवः पाठालयात् आगच्छन्ति अहं ।

७ उत्पीटिकायां छात्रस्य पुस्तकमस्ति ।

८ भारतदेशे जनाः गजाननं पूजयन्ति ।

९ कृषीवलाः सर्वदा एव उटजमागच्छन्ति ।

१० पराक्रमसमुद्रः किल सिन्धूपमानः इति जनाः वदन्ति ।

භාවිතයට

**सुखार्थी चेत् त्यजेद्विद्यां - विद्यार्थी चेत् त्यजेत् सुखम् ।**
**सुखार्थिनः कुतो विद्या - कुतो विद्यार्थिनः सुखम् ॥**

සැප කැමැත්තේ නම් ඉගෙනුම අත්හරින්නේ ය. ඉගෙනුම කැමැත්තෙහි නම් සැප අත්හරින්නේ ය. සැප කැමැත්තහුට ඉගෙනුමක් කොයින් ද?. ඉගෙනුම කැමැත්තහුට සැපක් කොයින් ද?.